# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை 2008
# Annual Performance Report

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2008

## අධ්‍යාපන අමාත්‍යාංශය

මෙම වාර්ෂික වාර්තාව රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි 2.1.4 ඡේදයට අනුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලදී.

2009 ජුනි


අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල

# අධ්‍යාපන අමාත්‍යාංශය
# වාර්ෂික වාර්තාව - 2008

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි 2.1.4 වගන්තියේ දැක්වෙන විධිවිධාන අනුව 2008 වර්ෂය සඳහා වූ මෙම අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව සකස් කොට ඉදිරිපත් කරනු ලබන අතර, රජයේ සාමාන්‍ය අධ්‍යාපන ක්‍රියාදාමය හා සම්බන්ධ සමස්ත සාරාංශයක් මෙහිලා ඉදිරිපත් කෙරෙන බව සතුටින් සඳහන් කරමි.

අධ්‍යාපනය සඳහා නව ස්ථිරසාර ප්‍රතිපත්තියක් සකස් කිරීමත්, ඒ තුළින් සාමාන්‍ය අධ්‍යාපනයේ ඉදිරි ගමන් මග උපරිම කාර්යක්ෂමතාවකින් හා ඵලදායිතාවකින් යුතු ව හැඩ ගස්වාලීමත් ප්‍රමුඛ අවශ්‍යතාවක් සේ හඳුනාගෙන, ඒ වෙනුවෙන් තවදුරටත් ක්‍රියා කිරීම අත්‍යාවශ්‍ය ව පවතී.

අධ්‍යාපනය සෘජුව ම රටේ ආර්ථික සමෘද්ධිය මෙන් ම නව පරපුරේ ආධ්‍යාත්මික දියුණුව තහවුරු කරමින් ඔවුන්ගේ විභව ශක්තීන් තුළින් දේශීය මෙන් ම ජාත්‍යන්තර අභියෝග ජය ගැනීමට අවැසි පහසුකම් සැලසීම අධ්‍යාපන අමාත්‍යාංශයේ සුවිශේෂී අරමුණක් බව කාරුණික ව සඳහන් කරමි.

නිදහස් අධ්‍යාපන අවශ්‍යතා තවදුරටත් සුරක්ෂිත කරමින් ගුණාත්මක බවින් ඉහළ අධ්‍යාපන අවශ්‍යතා පිළිබඳ ව සෑම දරුවකුගේ ම අයිතිය ආරක්ෂා කර ගැනීම හා වර්ධනය කර ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙවරක් ලෙස ප්‍රමුඛතාවයෙන් යුතු ව සැලකිල්ලට ගෙන ඇති බව මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

# පටුන

**පරිච්ඡේදය 1 ඃ අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳ ව කෙටියෙන්**

| | | |
|---|---|---|
| 1.1. | අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය | 1 |
| 1.2. | අධ්‍යාපන අමාත්‍යාංශයේ මූලික සංවිධාන ව්‍යුහය | 1 |
| 1.3. | අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන | 2 |
| 1.4. | පාසල් පද්ධතිය | 2 |
| 1.5. | පාසල් පද්ධතියේ ධ්‍රැවීකරණ ප්‍රවනතාව | 4 |

**පරිච්ඡේදය 2 ඃ අධ්‍යාපන ප්‍රවේශය සහ සහභාගිත්වය වැඩිකිරීම**

| | | |
|---|---|---|
| 2.1. | පාසල් පෙළපොත් සැපයීම | 7 |
| 2.2. | පාසල් නිලඇඳුම් සැපයීම | 9 |
| 2.3. | ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර | 9 |
| 2.4. | පාසල් සෞඛ්‍යය හා පෝෂණය | 9 |
| 2.5. | නොවිධිමත් අධ්‍යාපනය | 11 |
| 2.6. | විශේෂ අධ්‍යාපනය | 11 |
| 2.7. | සැමට අධ්‍යාපනය | 12 |

**පරිච්ඡේදය 3 ඃ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය**

| | | |
|---|---|---|
| 3.1. | ප්‍රාථමික අධ්‍යාපනය | 13 |
| 3.2. | විද්‍යා අධ්‍යාපනය | 13 |
| 3.3. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 14 |
| 3.4. | ඉංග්‍රීසි භාෂාව | 15 |
| 3.5. | ද්වි භාෂා | 15 |
| 3.6. | ආගමික හා සාරධර්ම අධ්‍යාපනය | 15 |
| 3.7. | සිංහල භාෂාව | 16 |
| 3.8. | දෙමළ භාෂාව | 16 |
| 3.9. | සෞන්දර්ය අධ්‍යාපනය | 16 |
| 3.10. | ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය | 17 |
| 3.11. | වතු පාසල් සංවර්ධනය | 17 |
| 3.12. | මුස්ලිම් පාසල් සංවර්ධනය | 17 |
| 3.13. | අධ්‍යාපනයේ ගුණාත්මක බව තහවුරු කිරීම | 18 |
| 3.14. | අධ්‍යාපන සාධන පිළිබඳ ප්‍රවනතා | 18 |

**පරිච්ඡේදය 4 ඃ මානව සම්පත් සැපයීම හා සංවර්ධනය**

| | | |
|---|---|---|
| 4.1. | උපාධිධාරී හා උපාධිධාරී නොවන ගුරුවරුන් බඳවා ගැනීම | 23 |
| 4.2. | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල හා ගුරු විද්‍යාලවල සිදු කරන ආයතනික ගුරු පුහුණුව | 24 |
| 4.2.1. | ගුරුවරුන් බඳවා ගැනීම | 24 |
| 4.2.2. | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ මගින් සිදු කරන ආයතනික ගුරු පුහුණුව සහ වෙනත් වැඩසටහන් | 25 |
| 4.2.3 | නව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ආරම්භය | 25 |
| 4.3. | අධ්‍යාපන කළමනාකරණ හා නායකත්ව සංවර්ධනය | 25 |

**පරිච්ඡේද 5 ඃ භෞතික පහසුකම් සැපයීම**

| | | |
|---|---|---|
| 5.1. | ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තු කිරීම | 27 |
| 5.2. | ඉගෙනුම් - ඉගැන්වීම් උපකරණ සැපයීම | 28 |

**පරිච්ඡේද 6 ඃ අධ්‍යාපන වියදම්**

| | | |
|---|---|---|
| 6.1. | පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් | 31 |
| 6.2. | අධ්‍යාපන සඳහා විදේශ ආධාර ආයෝජන | 32 |
| 6.2.1 | ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වූ වැඩසටහන් | 33 |
| 6.2.2 | ආසියානු සංවර්ධන බැංකු ආධාර ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන් සහ කාර්යයන් | 34 |


## වගු හා ප්‍රස්තාර


| | | |
|---|---|---|
| වගුව 1 .4.1 : | පාසල් සංඛ්‍යාව, ශිෂ්‍ය සංඛ්‍යාව හා ගුරු සංඛ්‍යාව පළාත් අනුව, 2008 | 2 |
| වගුව 1.4.2 : | පාසල් සංඛ්‍යාව ඒ ඒ පාසල් වර්ග අනුව | 3 |
| වගුව 1.4.3 : | පාසල් සංඛ්‍යාව ඉගැන්වීම් මාධ්‍ය අනුව | 3 |
| වගුව 1.4.4 : | පිරිවෙන් සංඛ්‍යාව, ගුරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව පළාත් අනුව | 3 |
| වගුව 1.4.5 : | පෞද්ගලික පාසල් සංඛ්‍යාව, ගුරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව | 4 |
| වගුව 1.5.1 : | ශිෂ්‍ය සංඛ්‍යාව 50 ට අඩු හා 2500 වැඩි පාසල් සංඛ්‍යාව හා ප්‍රතිශතය 2003 - 2008 | 4 |
| වගුව 1.5.2 : | ශිෂ්‍ය සංඛ්‍යාව 50 ට අඩු පාසල්වල ගුරු, ශිෂ්‍ය සංඛ්‍යා හා ශිෂ්‍ය ගුරු අනුපාතය | 5 |
| වගුව 1.5.3: | පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත්වීම අනුව පාසල් සංඛ්‍යාව - 2008 | 5 |
| සටහන ඃ | 2008 වර්ෂයේ දී බෙදාදෙන ලද 2009 වර්ෂයට අදාළ පාසල් පෙළපොත්, මාධ්‍ය අනුව | 7 |
| වගුව 3.14.1.: | 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල මාධ්‍ය අනුව - 2008 | 18 |
| | ප්‍රස්ථාරය ඃ 3.14.1.5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2008 ලකුණු 70 ට | 18 |

ඉහළින් ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය

වගුව 3.14.2.: අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 2006 - 2008 19

ප්‍රස්තාරය ෘ 3.14.2. ෘ අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 2006 - 2008 19

වගුව 3.14.3.: අ.පො.ස. (සා.පෙ) විභාගය 2008 ප්‍රධාන විෂයයන් අනුව සමත් ශිෂ්‍ය ප්‍රතිශතය 19

ප්‍රස්තාරය ෘ 3.14.3. ෘ අ.පො.ස. (සා.පෙ) විභාගය 2008 ප්‍රධාන විෂයයන් අනුව සමත් ශිෂ්‍ය ප්‍රතිශතය 19

වගුව 3.14.4.: අ.පො.ස. (සා.පෙ) විභාගය 2008 ප්‍රධාන විෂයයන් අනුව විභාගයට පෙනී සිටි හා සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 20

ප්‍රස්තාරය ෘ 3.14.4. ෘ අ.පො.ස. (සා.පෙ) විභාගය 2008 ප්‍රධාන විෂයයන් අනුව විභාගයට පෙනී සිටි හා සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 20

වගුව 3.14.5.: අ.පො.ස. (උ.පෙ) විෂයධාරාව අනුව විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලද ශිෂ්‍ය සංඛ්‍යාව 2008 20

ප්‍රස්තාරය ෘ 3.14.5. ෘ අ.පො.ස. (උ.පෙ) විෂය ධාරාව අනුව විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලද ශිෂ්‍ය සංඛ්‍යාව 2008 21

වගුව 3.14.6.: අ.පො.ස. (උ/පෙ) විෂයධාරාව අනුව විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලද ශිෂ්‍ය ප්‍රතිශතය 2007-2008 21

ප්‍රස්තාරය 3.14.6.ෘ අ.පො.ස. (උ/පෙ) විෂයධාරාව අනුව විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලද ශිෂ්‍ය ප්‍රතිශතය 2007-2008 21

වගුව 4.1.1.: ගුරුවරුන් සහ උපාධිධාරීන් බඳවා ගැනීම (2005 – 2008) 23

ප්‍රස්තාරය 4.1.1. ෘ රජයේ පාසල්වල ගුරුවරුන්ගේ වර්ධනය 2005 – 2008 23

වගුව 4.1.2: දළ ශිෂ්‍ය ගුරු අනුපාතය දිස්ත්‍රික් අනුව 24

වගුව 4.6.1.: නිලධාරීන් සඳහා දේශීය හා විදේශීය පුහුණු 2008 වර්ෂය සඳහා වූ කාර්ය සාධන සාරාංශ වාර්තාව 26

වගුව 6.1.1: මුළු ප්‍රතිපාදන හා සත්‍ය වියදම් ( පුනරාවර්තන ) - 2008 31

වගුව 6.1.2: ප්‍රතිපාදන හා සත්‍ය වියදම් ( ප්‍රාග්ධන ) - 2008 32

වගුව 6.1.3: රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමෙහි සාරාංශය 2008 32

# පරිච්ඡේදය 1 ඃ අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳ ව කෙටියෙන්

**දැක්ම**

ශ්‍රී ලාංකිය අනන්‍යතාවයේ හවුල්කරුවන් වන දක්ෂ පුරවැසි පිරිසක් මඟින් ජාත්‍යන්තර සමාජයේ විශිෂ්ටත්වය කරා එළඹීම

**මෙහෙවර**

පාර්ශ්වකරුවන් තෘප්තිමත් භාවයට පත්වන අයුරින් කාර්යක්ෂමතාව හා උසස් ගුණාත්මකභාවයට යොමුවන අධ්‍යාපනයේ නවීකරණය කරන ලද හා නූතන ප්‍රවේශයක් තුළින් ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට සරිලන පරිදි දක්ෂ පුරවැසි පිරිසක් බිහිකිරීම

## 1.1 අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය

- ජාතික අභිමතාර්ථ, අරමුණු හා ප්‍රතිපත්තිවලට අනුගත ව අධ්‍යාපන සංවර්ධන කාර්යයන් සැලසුම්කරණය, ක්‍රියාත්මක කිරීම, නියාමනය, ප්‍රගති සමාලෝචනය සහ ඇගයීම.
- අධ්‍යාපන සංවර්ධනය සඳහා ප්‍රමිති නිර්ණය කිරීම සහ එම ප්‍රමිති පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම වෙනුවෙන් පාසල් සහ අධ්‍යාපන ආයතනවල නිර්මාණාත්මක වැඩසටහන් දිරිගැන්වීම.
- අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාවට නැංවීමට හා පරිපාලන හා කළමනාකරණ කාර්යයන් විධිමත් ව පවත්වා ගැනීමට පළාත් අධ්‍යාපන බලධාරීන් සමඟ මනා සම්බන්ධීකරණය.
- ආධාර ආයතනවල සහාය ලබාදෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය.
- ඉගෙනුම් උපකරණ, පාසල් ගොඩනැගිලි හා ලී බඩු සඳහා ප්‍රතිමාන සහ පිරිවිතර සකස් කිරීම.
- සියලු ම සිසුන්ට පාසල් නිලඇඳුම් සැපයීම සහ අඩු ආදායම්ලාභී දක්ෂ සිසුන්ට ශිෂ්‍යාධාර ලබාදීම.

## 1.2 අධ්‍යාපන අමාත්‍යාංශයේ මූලික සංවිධාන ව්‍යුහය

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වය යටතේ අතිරේක ලේකම්වරු පස් දෙනෙකු යටතේ ප්‍රධාන අංශ පහක් තුළින් අමාත්‍යාංශයේ පාලන ව්‍යුහය ක්‍රියාත්මක වේ. ප්‍රධාන ගණකාධිකාරිවරයකු යටතේ මූල්‍ය කළමනාකරණ ව්‍යුහය ක්‍රියාත්මක වන අතර අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් හා ඒ ඒ ශාඛා හා උප අංශ ක්‍රියාත්මක වේ.

ලේකම්

- අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සැලසුම් හා නියාමන )
- අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන)
- අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා හා ආයතන )
- අතිරේක ලේකම් (පාසල් සැපයීම් සේවා හා ඉදිකිරීම්)
- අතිරේක ලේකම් (පාලන හා මුදල්)

## 1.3 අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන

- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
- ජාතික අධ්‍යාපන ආයතනය
- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
- ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
- ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව

## 1.4 පාසල් පද්ධතිය

සිසුන් වෙත අධ්‍යාපනය සැපයීම සඳහා දිවයින පුරා විහිදුණු පාසල් ජාලයක් ඇත.රජයේ පාසල්, පිරිවෙන්, ගාස්තු අය කරන මෙන් ම අය නොකරන පාසල් හා විශේෂ පාසල් මේ අතර ප්‍රධාන තැනක් ගනී. පළාත් අනුව රජයේ පාසල් විසිරී ඇති අන්දම හා එම පාසල්වල සිටින ගුරු, ශිෂ්‍ය සංඛ්‍යාවන් 1.4.1 වගුවෙන් දැක්වේ.

**වගුව 1 .4.1 : පාසල් සංඛ්‍යාව, ශිෂ්‍ය සංඛ්‍යාව හා ගුරු සංඛ්‍යාව පළාත් අනුව, 2008**

| පළාත | පාසල් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව | ගුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| බස්නාහිර | 1,340 | 896,497 | 41,237 |
| මධ්‍යම | 1,458 | 517,070 | 31,424 |
| දකුණ | 1,094 | 505,860 | 29,538 |
| නැගෙනහිර | 969 | 378,185 | 17,528 |
| ඌව | 832 | 280,054 | 17,316 |
| සබරගමුව | 1,099 | 365,760 | 21,833 |
| උතුර | 877 | 261,477 | 12,204 |
| වයඹ | 1,218 | 468,242 | 26,952 |
| උතුරු මැද | 774 | 252,167 | 14,084 |
| **ශ්‍රී ලංකාව** | 9,661 | 3,925,302 | 212,116 |

*මූලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය* - 2008

රජයේ පාසල් 1AB, 1C 2 වර්ගය, 3 වර්ගය යනුවෙන් වර්ග කර ඇත. 1AB පාසල් වල අ.පො.ස. (උ.පෙ) සියලු ම විෂය ධාරාවන් ඉගැන්වෙන අතර, 1C පාසල් වල, උසස් පෙළ දක්වා පන්ති ඇතත්, අ.පො.ස. (උ.පෙ) විද්‍යාව හා ගණිත විෂය ධාරාවන් නැත. 2 වර්ගයේ පාසල් අ.පො.ස. (සා.පෙ) දක්වා පන්ති පවත්වන අතර, 3 වර්ගයේ පාසල් වල ඇත්තේ ප්‍රාථමික (ශ්‍රේණි 1 - 5) පමණි. 1.4.2. වගුව මෙම වර්ගවල පාසල් සංඛ්‍යාවන් දක්වා ඇත.

**වගුව 1.4.2 ඃ පාසල් සංඛ්‍යාව ඒ ඒ පාසල් වර්ග අනුව**

| වර්ගය අනුව | 1AB | 1C | 2වර්ගය | 3 වර්ගය | එකතුව |
|---|---|---|---|---|---|
| පාසල් සංඛ්‍යාව | 698 | 1,933 | 4,158 | 2,872 | 9,661 |

*මූලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය - 2008*

ඉගැන්වීමේ මාධ්‍යය අනුව ද පාසල් සංඛ්‍යාවන් වෙන් කොට හඳුනා ගත යුතු ය. ප්‍රධාන වශයෙන් ඉගැන්වීමේ මාධ්‍ය සිංහල හෝ දෙමළ වන අතර, පාසල් ස්වල්ප ප්‍රමාණයක සිංහල හා දෙමළ මාධ්‍ය පන්ති පැවැත් වේ. ද්විභාෂා ප්‍රතිපත්තිය යටතේ සමහර පාසල්වල ප්‍රධාන විෂයයන් කිහිපයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම සිදු කෙරේ. මෙම තත්ත්වය 1.4.3. වගුවෙන් පැහැදිළි වේ.

**වගුව 1.4.3 ඃ පාසල් සංඛ්‍යාව ඉගැන්වීම් මාධ්‍ය අනුව**

| මාධ්‍යය | සිංහල | දෙමළ | සිංහල සහ දෙමළ | සිංහල සහ ඉංග්‍රීසි | දෙමළ සහ ඉංග්‍රීසි | සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| පාසල් සංඛ්‍යාව | 6,367 | 2,786 | 50 | 314 | 111 | 33 | 9,661 |

*මූලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය - 2008*

ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ දීර්ඝ ඉතිහාසයක් ඇත. සෑම පළාතක ම පාහේ පිරිවෙන් පවත්වාගෙන යන අතර, පළාත් අනුව පිරිවෙන් සංඛ්‍යාවේ ව්‍යාප්තිය හා ඒවායේ ඉගැන්වීමේ යෙදෙන ගුරුභවතුන් හා ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාවන් 1.4.4. වගුවෙහි දැක්වේ.

**වගුව 1.4.4 ඃ පිරිවෙන් සංඛ්‍යාව, ගුරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව පළාත් අනුව**

| පළාත | පිරිවෙන් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව | ගුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| බස්නාහිර | 143 | 12653 | 1249 |
| මධ්‍යම | 101 | 7486 | 774 |
| දකුණ | 154 | 10751 | 1319 |
| උතුර | 1 | 276 | 0 |
| නැගෙනහිර | 23 | 1191 | 102 |
| වයඹ | 88 | 7908 | 810 |
| උතුරු මැද | 54 | 4192 | 383 |
| ඌව | 52 | 4263 | 459 |
| සබරගමුව | 75 | 7345 | 648 |
| **එකතුව** | 691 | 56065 | 5744 |

*මූලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය - 2008*

පාසල් රජයට පවරා ගැනීමේ දී පාසල් කිහිපයක් රජයෙන් කිසිදු ආධාරයක් නොලබා, ගාස්තු අයකරන පෞද්ගලික පාසල් ලෙස පවත්වාගෙන යෑමට එකඟ විය. තවත් පාසල් කිහිපයක් ගුරු වැටුප් පමණක් රජයෙන් ලබාගෙන ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල් බවට පත්විය. මේ පිළිබඳ විස්තර 1.4.5. වගුවේ දැක්වේ.

**වගුව 1.4.5 ඃ පෞද්ගලික පාසල් සංඛ්‍යාව, ගුරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව**

| පළාත | විශේෂ පාසල් ද ඇතුළත් ව පෞද්ගලික පාසල් සංඛ්‍යාව | | | ශිෂ්‍ය සංඛ්‍යාව | ගුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | ගාස්තු අය කරන | ගාස්තු අය නොකරන | එකතුව | | |
| බස්නාහිර | 23 | 30 | 53 | 87,039 | 3,974 |
| මධ්‍යම | 6 | 5 | 11 | 11,053 | 592 |
| දකුණ | 1 | 10 | 11 | 5,132 | 283 |
| උතුර | 2 | 4 | 6 | 8,055 | 343 |
| නැගෙනහිර | 0 | 1 | 1 | 36 | 7 |
| වයඹ | 0 | 2 | 2 | 915 | 84 |
| උතුරු මැද | 1 | 2 | 3 | 213 | 40 |
| ඌව | 3 | 2 | 5 | 2,414 | 169 |
| සබරගමුව | 0 | 2 | 2 | 237 | 27 |
| **එකතුව** | **36** | **58** | **94** | **115,058** | **5,519** |

*මූලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය - 2008*

## 1.5 පාසල් පද්ධතියේ ධ්‍රැවීකරණ ප්‍රවනතාව

කුඩා පාසල් තවදුරටත් කුඩාවීමේ හා විශාල පාසල් තවදුරටත් විශාලවීමේ ප්‍රවනතාව 2008 වසරේ ද දක්නට ලැබුණි. ශිෂ්‍ය සංඛ්‍යාව පනහට අඩු පාසල් 1437 ක් 2003 වර්ෂයේ පැවතුණු අතර, 2008 දී එම සංඛ්‍යාව 1520 දක්වා වර්ධනය වී ඇත. සිසුන් පනහට අඩු පාසල්වලට ගුරුවරුන් සැපයීමේ දී ගුරු-සිසු අනුපාතය 6 ඃ 1 ලෙස පවත්වාගෙන යෑමට සිදුවිය. පළමුවන ශ්‍රේණිය සඳහා කිසිදු ශිෂ්‍යයෙකු ඇතුළු නොවූ පාසල් 306 ක් 2008 වසරේදී දක්නට ලැබිණ. මෙම තත්ත්වය 1.5.2., 1.5.2. හා 1.5.3. වගු වලින් පැහැදිළි වන අතර, මේ පිළිබඳ විශේෂ අවධානයක් ඉදිරි කාලයේ දී යොමු විය යුතු ය.

**වගුව 1.5.1 ඃ ශිෂ්‍ය සංඛ්‍යාව 50 ට අඩු හා 2500 වැඩි පාසල් සංඛ්‍යාව හා ප්‍රතිශතය 2003 - 2008**

| ශිෂ්‍ය සංඛ්‍යාත පරාසය | 2003 | | 2007 | | 2008 | |
|---|---|---|---|---|---|---|
| | පාසල් | ප්‍රතිශතයක් | පාසල් | ප්‍රතිශතයක් | පාසල් | ප්‍රතිශතයක් |
| ශිෂ්‍ය සංඛ්‍යාව 50 ට අඩු | 1437 | 14.7 | 1533 | 15.8 | 1520 | 15.73 |
| ශිෂ්‍ය සංඛ්‍යාව 2500 ට වැඩි | 141 | 1.4 | 167 | 1.7 | 163 | 1.69 |

*මූලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය - 2008*

වගුව 1.5.2 ඃ ශිෂ්‍ය සංඛ්‍යාව 50 ට අඩු පාසල්වල ගුරු, ශිෂ්‍ය සංඛ්‍යා හා ශිෂ්‍ය ගුරු අනුපාතය

| පාසල් සංඛ්‍යාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු ගුරුවරු සංඛ්‍යාව | මුළු පාසල් සංඛ්‍යා ව ප්‍රතිශතයක් ලෙස | මෙම පාසල්වල ගුරු ශිෂ්‍ය අනුපාතය | සමස්ත පාසල්වල ගුරු ශිෂ්‍ය අනුපාතය |
|---|---|---|---|---|---|
| 1,520 | 42,910 | 7,328 | 15.73 | 6:1 | 18:1 |

*මූලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය - 2008*

වගුව 1.5.3: පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත්වීම අනුව පාසල් සංඛ්‍යාව - 2008

| පළමු ශ්‍රේණියේ ශිෂ්‍ය සංඛ්‍යාව | පාසල් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| **0** | 306 | 3.17 |
| **1-9** | 2,273 | 23.53 |
| **10-40** | 4,488 | 46.45 |
| **41-200** | 2,141 | 22.16 |
| **200ට වැඩි** | 152 | 1.57 |

*මූලාශ්‍රය - වාර්ෂික පාසල් සංගණනය - 2008*

# පරිච්ඡේදය 2ඃ අධ්‍යාපන ප්‍රවේශය සහ සහභාගිත්වය වැඩිකිරීම

2008 වර්ෂය තුළ අධ්‍යාපනයට සිසුන් ඇතුළත් කර ගැනීම හා රඳවා තබාගැනීම සඳහා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී. වයස අවුරුදු 6 - 14 අතර සිසුන් පාසල් වෙත යොමුකිරීම සඳහා අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට අමතර ව වෙනත් ක්‍රියාකාරකම් රාශියක් ක්‍රියාවට නැංවින. නොමිලයේ පාසල් පෙළපොත් ලබාදීම, පාසල් නිලඇඳුම් ලබාදීම, ශිෂ්‍යාධාර ලබාදීම, පාසල් දිවා ආහාර සැපයීම මෙන් ම සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් මෙම ක්‍රියාකාරකම් අතර ප්‍රධාන තැනක් ගනී. විධිමත් පාසලට ඇතුළත් කර ගැන්මට නොහැකි සිසුන් සඳහා නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් යටතේ විවිධ ක්‍රියාකාරකම් දියත් කරන ලද අතර, විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා විශේෂ අධ්‍යාපන වැඩසටහන් තවදුරටත් ක්‍රියාත්මක විය.

## 2.1. පාසල් පෙළපොත් සැපයීම

1980 දී පාසල් පෙළපොත් නොමිලයේ ලබාදීමට ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණය අනුව රජයේ පාසල්වල සහ රජයේ ආධාර ලබන පාසල්වල 1 - 11 දක්වා ශ්‍රේණිවල ඉගෙනුම් ලබන සමස්ත සිසු පරපුර වෙත සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් අදාළ පරිදි පෙළපොත් ලබාදීම 2008 වර්ෂයේ දී ඉටු කරන ලදී. ඒ අතර 3-11 දක්වා ශ්‍රේණිවල සිසුන්ට ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය විෂයයක් වශයෙන් ඉගැන්වීම සඳහා පෙළපොත් හා වැඩ පොත් ලබාදීමට ද පියවර ගනු ලැබීය. 2009 වර්ෂය සඳහා 2008 දී මුද්‍රණය කර බෙදා හරින ලද පෙළපොත් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය අනුව බෙදී ඇති ආකාරය පහත සඳහන් කර ඇති වගුවේ දැක්වේ.

**සටහනඃ 2008 වර්ෂයේදී බෙදා දෙන ලද 2009 වර්ෂය ට අදාල පාසල් පෙළපොත්, මාධ්‍ය අනුව**

| අනු අංකය | මාධ්‍යය | පොත් වර්ග සංඛ්‍යාව | බෙදා දුන් පොත් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | සිංහල මාධ්‍ය පොත් | 131 | 13,852,160 |
| 2. | දෙමළ මාධ්‍ය පොත් | 128 | 6,269,370 |
| 3. | ඉංග්‍රීසි මාධ්‍ය පොත් | 38 | 350,583 |
| 4. | ඉංග්‍රීසි භාෂාව පොත් | 20 | 5,781,163 |
| 5. | පිරිවෙන් - සිංහල මාධ්‍ය පොත් | 31 | 108,571 |
| 6. | පිරිවෙන් - ඉංග්‍රීසි මාධ්‍ය පොත් | 04 | 18,527 |
| | එකතුව | 352 | 26,380,374 |

මීට අමතර ව, අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබන සියලු ම පාසල් සිසුනට General English for G.C.E. Advance Level Classes නමින් ඉංග්‍රීසි භාෂා පෙළපොතක් නොමිලේ සපයන ලද අතර, ඊට අදාළ ගුරු අත්පොත් ගුරුවරුන් වෙත නිකුත් කරන ලදී.

පාසල් පෙළපොත් සම්පාදනයේ දී ජාතික අධ්‍යාපන ආයතනය මගින් නිකුත් කෙරෙන විෂයමාලා සහ විෂය නිර්දේශ පාදක කොට ගනු ලබන අතර, එමගින් පොදු ජාතික ප්‍රතිපත්තියක් හා පොදු නිපුණතා පද්ධතියක් මත පෙළපොත් සම්පාදනය කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත.

## නව ප්‍රවේශයක්

2008 පාසල් වර්ෂය අවසාන වීමට පෙර නව වර්ෂය සඳහා අවශ්‍ය සියලු ම පාසල් පෙළපොත් පාසල් සිසුන් අතට පත් කිරීමේ වැඩ පිළිවෙල සාර්ථක කර ගැනීම සඳහා පොත් බෙදාදීමේ වැඩසටහනට නව උපායමාර්ග කිහිපයක් එක් කරන ලදී. දිවයින පුරා පිහිටි ජාතික පාසල්වලට ද, ශිෂ්‍ය සංඛ්‍යාව 2000 ට වැඩි වන පළාත් පාසල්වලට ද රජයේ අනුග්‍රහයෙන් නොමිලේ පෙළපොත් ලබා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 2000 ට වැඩි පෞද්ගලික පාසල් වලට ද කොළඹ දිස්ත්‍රික්කයේ හා නුගේගොඩ කලාපයේ සියලු ම පාසල්වලට ද සෘජුව ම පෙළපොත් නිකුත් කරන ලදී. මීට අමතර ව සබරගමුව පළාතේ හඳුනාගත් බෙදාහැරීමේ මධ්‍යස්ථාන ජාලයක් හරහා පළාත් පාසල්වලට පොත් බෙදාහැරීමේ නියාමක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. මේ ක්‍රමය බොහෝදුරට සාර්ථක වී ඇති අතර, මේ හේතුවෙන් කොට්ඨාස කාර්යාලවල කාර්ය භාරය අඩු වී ඇති අතර කඩිනමින් දරුවන් වෙත පෙළපොත් ලබාදීමට හැකි වී ඇත.

## පෙළපොත් නැවත භාවිතය

පාසල් සිසුන් ට නොමිලේ සපයනු ලබන පෙළපොත් වර්ෂය අවසානයේ දී නැවත භාවිතය සඳහා පාසලට ආපසු භාරදිය යුතුය. පෙළපොත්වල ආයු කාලය වසර 03 ක් දක්වා වැඩිකිරීමේ අරමුණ ඇති ව පොත්වල භෞතික ගුණාත්මකභාවය වැඩිදියුණු කරන ලදී. එය අර්ථාන්විත පියවරක් වුව ද, එමගින් අපේක්ෂිත ප්‍රතිඵල අත් නොවීය. පොදුවේ ගත් විට, වාර්ෂික ව 80% කට ආසන්න පෙළපොත් ප්‍රමාණයක් නැවත මුද්‍රණය කිරීමට සිදුවන බව පාසල් වලින් හා කොට්ඨාස කාර්යාල වලින් ලැබෙන තොරතුරු මත නිගමනය කිරීමට සිදුවිය.
2008 දී පොළපොත් නැවත භාවිතය සම්බන්ධයෙන් සෘජු ක්‍රියාමාර්ග කිහිපයක් ගනු ලැබිණ.

## ප්‍රශස්ත පෙළපොත් භාවිතය වෙනුවෙන් සහතික පත්‍ර ප්‍රදානය

පාසල් පෙළපොත් නැවත භාවිතය පිළිබඳ ව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 1/33 හා 2008.23 දරන චක්‍රලේඛයෙහි V වන වගන්තිය සමගින් නිර්දේශිත පරිදි, 2008 වසරේ සෑම පන්තියක ම ඉතා ම හොඳින් පෙළපොත් පරිහරණය කර ඇති බව සනාථ වූ ශිෂ්‍යයන් තිදෙනෙකුට සහතික පත් හා තෑගි ප්‍රදානය කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලදී.
සහතික පත් ප්‍රදානය කිරීමේ දිනය වශයෙන් දිවයින පුරා පාසල් පෙළපොත් බෙදාදීමේ දිනය වූ 2008 දෙසැම්බර් 04 යොදා ගැනිණි.
මෙම වැඩසටහන් මගින් 2008 වර්ෂයේ දී පෙළපොත් නාස්තිය බොහෝදුරට සීමා කර ගැනීමටත් නැවත භාවිතය 23% දක්වා වර්ධනය කර ගැනීමටත් හැකි වී ඇත.

## වෙබ් අඩවිය හරහා පෙළපොත්

2009 වර්ෂය සඳහා අලුතින් සම්පාදනය කරන ලද 8 වන ශ්‍රේණියේ පෙළපොත් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට ඇතුළත් කර තිබේ. ඉංග්‍රීසි, සිංහල හා දෙමළ මාධ්‍යවලින් වෙබ් අඩවිය ඔස්සේ නිකුත් කර ඇති පොත් වර්ග ගණන 41 කි.

**වෙබ් අඩවියට ප්‍රවේශ වීම** **www.edupub.gov.lk**

පෙළපොත් CD තැටි මඟින්: තොරතුරු තාක්ෂණ ඒකකය මඟින් සම්පාදනය කරන ලද 6 හා 10 ශ්‍රේණිවල ප්‍රධාන විෂයයන්ට අයත් පෙළපොත් CD තැටි මඟින් වෙළඳපොලෙන් මිල දී ගත හැකි ය.
එක් එක් CD තැටි යෙහි අන්තර්ගත විෂයයන් මෙහි දැක්වේ.

| අනු අංකය | විෂයය | මාධ්‍යය |
|---|---|---|
| CD 1 | සිංහල භාෂාව හා සාහිත්‍යය 6 | සිංහල |
| | ගණිතය 6 | සිංහල |
| | විද්‍යාව 6 | සිංහල |
| CD 2 | ගණිතය 10 | සිංහල |
| | බුද්ධ ධර්මය 10 | සිංහල |
| | ඉංග්‍රීසි සිසු පොත 10 | ඉංග්‍රීසි |

## 2.2. පාසල් නිල ඇඳුම් සැපයීම

2009 වර්ෂයට අදාළ ව රජයේ සහ රජයේ අනුමත පාසල්වල ඉගෙනුම ලබන, අවුරුදු 06 සිට 19 දක්වා වයස් කාණ්ඩවල සියලු ම සිසුන් වෙත නිල ඇඳුම් සඳහා රෙදි නිකුත් කරන ලදී. රජයේ අනුමත පිරිවෙන්වල ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා වෙත සිවුරු රෙදි නොමිලයේ සපයා දෙන ලදී.

සිසු සංඛ්‍යාව - 39,300,451

භික්ෂුසංඛ්‍යාව - 56,065

වාර්ෂික වියදම - රු.මිලියන 581.92

## 2.3. ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර

2008 වර්ෂය තුළ අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන් 14,988 දෙනෙකු ශිෂ්‍යාධාර ලැබූ අතර, සිසුන් 21,035 ක් ජනප්‍රිය පාසල්වලට යොමු කරනු ලැබීය. ශිෂ්‍යාධාර සඳහා රුපියල් මිලියන 232.6 ක් (ආසන්න වශයෙන්) විදයම් කරන ලදී.

- මේ හැරුණු විට ඉන්දියානු රජයේ හා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයයේ මූල්‍ය අනුග්‍රහය යටතේ, අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ඉහළ ප්‍රවීණත්වයක් ලැබූ අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන් 100 ක් සඳහා මහත්මා ගාන්ධි ශිෂ්‍යත්වය ප්‍රදානය කරන ලදී.
- ආසියානු පැසිෆික් ළමා සමුළුවට සිසුහු 08 දෙනෙක් භාරකරුවන්ද සමඟ සහභාගි වූහ.

## 2.4. පාසල් සෞඛ්‍යය හා පෝෂණය

අමාත්‍යාංශයේ පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව වර්ෂය තුළ ඉටුකරන ලද ප්‍රධාන කාර්යන් හා ඇති කරගත් ඉලක්ක කිහිපයක් පහත දැක්වේ.

- **පාසල් සිසුන් සඳහා දිවා ආහාර ලබාදීම**

දිවා ආහාර වැඩසටහන පාසල් 6025 ක්‍රියාත්මක කරන ලද අතර, ශිෂ්‍ය ශිෂ්‍යාවන් 575,689 ක් එහි ප්‍රතිඵල ලබා ගත්හ. මේ සඳහා රුපියල් මිලියන 1648ක් ආයෝජනය කරන ලදී. ආර්ථික දුෂ්කරතා සහිත පාසල් දරුවන්ගේ පෝෂණ මට්ටම් වැඩි දියුණු කිරීම, පාසල් දරුවන් අතර පවතින ඉහළ මන්දපෝෂණ අනුපාතය අවම කිරීම සහ අධ්‍යාපනය සඳහා ක්‍රියාකාරී සහභාගිත්වය සහතික කරලීමත් උසස් මානසික හා ශාරීරික සෞඛ්‍යයක් මෙහිලා අපේක්ෂිත මූලික ඉලක්කය විය.

- **ලෝක ආහාර වැඩ සටහන**

මෙම වැඩසටහනට පාසල් 1,568 ක සිසුන් 373,332 ක් සහභාගි වූ අතර ඒ සඳහා රුපියල් මිලියන 91 ක් ආයෝජනය කරන ලදී. වැඩසටහන මගින් අපේක්ෂිත ඉලක්ක අතර

- දුෂ්කර ප්‍රදේශවල පාසල් සිසුන්ගේ දෛනික පාසල් පැමිණීම වර්ධනය කිරීම,
- සමතුලිත ආහාර වේලක් ලබාගැනීමට යොමු කිරීම.
- සිසු දෛනික පැමිණීම වර්ධනය කිරීම හා
- සිසුන් පාසල් වලින් ගිලිහී යාම අවම කිරීම ප්‍රධාන තැනක් ගන්නා ලදී.

- **සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන**

මෙම වැඩසටහනේ ප්‍රධානත ම ඉලක්ක වූයේ

- යහපත් සෞඛ්‍ය පුරුදු සිසුන් තුළ ප්‍රචලිත කිරීම.
- පුද්ගල කුසලතා වර්ධනය කිරීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති සැකසීම
- සෞඛ්‍ය ප්‍රවර්ධනයට හිතකර පරිසරයක් ඇති කිරීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධනයට අවශ්‍ය සේවාවන් ලබා දීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා පාසල් ප්‍රජා සබඳතා වර්ධනය
- සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය නිපුනතා වර්ධනය

යන මේවාය

සෞඛ්‍ය ප්‍රවර්ධන හා HIV/AIDS නිවාරණ වැඩසටහන යටතේ දැනුවත් කිරීම හා අතිරේක අධ්‍යාපන උපකරණ ලබාදීම සිදු කරන ලදී. දැනුවත් කිරීමේ වැඩමුළු 05 ක් පවත්වන ලද අතර, සහභාගි වීම 313 කි. සම්පත්දායකයින්, ප්‍රාථමික හා ද්විතීයික අංශයේ ගුරුවරුන් හා සිසු දරුවන් පහත සඳහන් කරුණු ඔස්සේ දැනුවත් කරන ලදී.

- යහපත් සෞඛ්‍යය
- යොවුන්විය
- පෝෂණය හා ව්‍යායාම
- බෝ නොවන රෝග

- මනෝ සමාජීය නිපුණතා
- ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග හා HIV/AIDS
- සෞඛ්‍ය ප්‍රවර්ධනය

## 2.5. නොවිධිමත් අධ්‍යාපනය

මේ යටතේ ඉගෙනුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යෑම, විවිධ ජන කොට්ඨාස දැනුවත් කිරීම් හා උපකරණ බෙදාදීම සිදු කරන ලදී.

- ප්‍රජා ඉගෙනුම් මධ්‍යස්ථාන ඃ කලාප මට්ටමින් මධ්‍යස්ථාන 176 ක්‍රියාත්මක කළ අතර 30,000 කට ප්‍රතිලාභ අත්විය.
- කාර්යබද්ධ සාක්ෂර මධ්‍යස්ථාන ඃ පළාත් මට්ටමින් මධ්‍යස්ථාන 36 ක් ක්‍රියාත්මක විය. බන්ධනාගාර වැඩසටහන් 31 ට 1250 දෙනෙක් සහභාගි වූහ.
- මාවත්වාසී ළමුන් සඳහා මධ්‍යස්ථාන 05 කදී වැඩසටහන් පවත්වා ඇති අතර, ඉන් 250 දෙනෙකු ප්‍රතිලාභ ලබා ඇත.
- අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා කලාප මට්ටමේ නිලධාරීන් හා අනිවාර්ය අධ්‍යාපන කමිටු දැනුවත් කිරීමට පියවර ගන්නා ලදී. ඒ යටතේ පාසල් නොයන ළමුන් 2132 ක් විධිමත් අධ්‍යාපනයට යොමු කිරීමට හැකිවිය.
- නොවිධිමත් අධ්‍යාපන කටයුතු හා ප්‍රජා ඉගෙනුම් මධ්‍යස්ථාන වැඩසටහන් පිළිබඳ දැනුවත් කිරීම හා පාසල් නොයන ළමුන් පිළිබඳ සමීක්ෂණයේ නියාමන හා අධීක්ෂණ කටයුතු සඳහා ක්‍රියාකාරකම් දියත් කරන ලදී.
- නොවිධිමත් අධ්‍යාපන වෘත්තිකයන් 200 ක් දැනුවත් කිරීමට පියවර ගෙන ඇත.
- ප්‍රජා ඉගෙනුම් මධ්‍යස්ථාන 36 ක් සඳහා ක්‍රීඩා උපකරණ ලබාදීම ද සිදුවිය.

ඉහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා රුපියල් මිලියන 6 ක් වැය විය.

## 2.6. විශේෂ අධ්‍යාපනය

විශේෂ අධ්‍යාපන කමිටු පවත්වාගෙන යෑම, විෂයමාලා මුද්‍රණය, ජාතික හා පළාත් සම්පත් මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම, විශේෂ පාසල් ගුරුවරුන්ට වැටුප් ගෙවීම, විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා ඇස් කණ්නාඩි හා සවන්වහල් සැපයීම, ගුරු පුහුණු හා අවැසි අනෙකුත් උපකරණ බෙදාදීම මෙම වර්ෂයේ දී ඉටුකරන ලද ප්‍රධාන කාර්යභාරය අතර විය. ගුරු පුහුණුව යටතේ පුහුණුව ලබාදෙන ක්ෂේත්‍රයන් අතර පහත දැක්වෙන ඒවා ද විය.

- සංඥා භාෂා පුහුණුව
- බ්‍රේල් පෙළපොත් සැකසීම
- ඔටිසම් පුහුණුව
- බ්‍රේල් පුහුණුව
- විශේෂ පාසල් විදුහල්පතිවරු පුහුණුව
- ශ්‍රවන ඌනතා සහිත සිසුන්ට ඉගැන්වීමේ ක්‍රම පිළිබඳ පුහුණුව

ගුරු පුහුණුව හා බ්‍රේල් යන්ත්‍ර ලබාදීම හා බ්‍රේල් මුද්‍රණාලය අලුත්වැඩියා කිරීම සඳහා රුපියල් මිලියන 2 ක් පමණ ද, විශේෂ පාසල්වල ගුරු භවතුන් 450 ක් සඳහා වැටුප් ගෙවීමට රුපියල් මිලියන 72 ක් පමණ ද වැය වී ඇත.

## 2.7. සැමට අධ්‍යාපනය

සැමට අධ්‍යාපන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, මෙම වසර තුළ විශේෂ අවධානයට යොමු වු වැඩසටහන් හා ලබාගත් ප්‍රගතිය සැකෙවින් පහත දැක්වේ.

- සැමට අධ්‍යාපන මධ්‍ය දශක වාර්තාව සැකසීමඃ මෙම වාර්තාවේ අවසාන පිටපත සකස් කොට සිංහල සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීමට හැකිවිය. මෙම වාර්තාව, දකුණු ආසියානු කලාපීය රටවල් අතුරෙන් ඉදිරිපත් වූ හොඳම වාර්තාව ලෙස යුනෙස්කෝ බැංකොක් ආයතනය ප්‍රකාශයට පත්කර ඇත.

- අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ජාතික සමීක්ෂණයඃ ජාතික අධ්‍යාපන පර්යේෂණ හා ඇගයීම් මධ්‍යස්ථානය (නෙරෙක්) National Education Research and Evaluation Centre (NEREC) ආයතනය ද සමඟ එක් ව මෙම සමීක්ෂණය කරන ලද අතර, ඒ මගින් ශ්‍රී ලංකාවේ පාසල් නොයන ළමුන් හඳුනා ගැනීමට හැකිවිය. ඒ පිළිබඳ වාර්තාව පිළියෙල කොට ඇත.

- මුල් ළමාවිය රැකවරණය හා අධ්‍යාපනය පිළිබඳ දත්ත පාදකයන් සැකසීම ඃ මේ සම්බන්ධයෙන් පළාත් මට්ටමින් තොරතුරු ලබාගෙන, ඒවා යාවත්කාලීන කිරීමට හැකිවිය.

- සංඛ්‍යාන ධාරිතා සංවර්ධනය ඃ මේ සඳහා ජාතික හා පළාත් මට්ටමින් නිලධාරීන් පුහුණු කර ඇත. පුහුණුව ලැබූ නිලධාරීන් අතර ජාතික මට්ටමින් 35 ක්ද, උතුරුමැද 37 ක්ද, ඌව 32 ක්ද, මධ්‍යම 54 ක්ද, දකුණු පළාතේ 31 ක්ද වේ.

- වර්ෂයට අදාළ ව අධ්‍යාපන දර්ශක සකසා ඇත.

# පරිච්ඡේදය 3ඃ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය

අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහනේ ප්‍රධාන තේමාවක් ද වන අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය, සංරචක කිහිපයක් ඔස්සේ තවදුරටත් ඉදිරියට ගෙන යන ලදී. අධ්‍යාපනයේ අන්තර්ගතය වන විෂයමාලාව සිසුන් වෙත ඉදිරිපත් වන්නේ පංති කාමරය තුළ දී ය. මෙම කාර්යය ඵලදායි ලෙස ඉටුකර ගැන්ම සඳහා ගුරු සංවර්ධනය කෙරෙහි මෙන් ම පංති කාමරය තුළ සිදුවන ඉගෙනුම් - ඉගැන්වීමේ ක්‍රියාවලිය කෙරෙහි ද දැඩි අවධානයක් යොමු විය. ගෝලීය සමාජයක් තුළ වැඩදායක පුරවැසියන් ලෙස කටයුතු කිරීමට අප සිසුන්ට ද හැකියාව ලබාදීම සඳහා විද්‍යාව, තොරතුරු තාක්ෂණය, ගණිතය, ඉංග්‍රීසි, ද්විභාෂා අධ්‍යාපනය වැනි විෂයයන් සුවිශේෂ අවධානයට ලක් වූ අතර, සමබර සංවර්ධනයට යොමු වන "සමස්ත අධ්‍යාපනය" ගැන අවධානය යොමු කරමින් ආගමික අධ්‍යාපනය, මව්බස, සෞන්දර්ය අධ්‍යාපනය, ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය වැනි විෂයයන් සාර්ථකව ඉගැන්වීම සඳහා ද විශේෂ ක්‍රියාකාරකම් දියත් විය. ඒ ඒ අංශ යටතේ ගන්නා ලද සුවිශේෂ පියවර, සංක්ෂිප්ත ව පහත දක්වා ඇත.

## 3.1. ප්‍රාථමික අධ්‍යාපනය

ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම මෙම වර්ෂය තුළ ද ප්‍රධාන ඉලක්කයක් ව පැවතුණි. ඒ සඳහා භෞතික පහසුකම් සැපයීම මෙන් ම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයන් ශක්තිමත් කිරීම තවදුරටත් සිදු කෙරිණ. වර්ෂය තුළ ක්‍රියාවට නංවන ලද ප්‍රධාන කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

- ළමා මිතුරු පාසල් ආකෘතියේ මාන හා දර්ශක හඳුනා ගන්නා ලද අතර, මානවලට අදාළ නිර්ණායක හඳුන්වා දෙන ලදී.
- පස්වන ශ්‍රේණියේ විෂය නිර්දේශ සඳහා වෙනස්වීම් හඳුන්වා දීමඃ මේ පිළිබඳ චක්‍රලේඛ සකස් කොට ඒ සම්බන්ධව පළාත් හා පාසල් දැනුවත් කරන ලදී.
- උසස් මට්ටමේ අධ්‍යාපන ක්‍රියාවලීන් යටතේ පාසල්වල ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමඃ පාසල් වලින් ව්‍යාපෘති යෝජනා ගෙන්වා ගන්නා ලද අතර, සුදුසු ව්‍යාපෘති සඳහා මුදල් ලබාදෙන ලදී.
- ප්‍රාථමික පාසල්වල විෂය සමගාමී ක්‍රියාකාරකම් පවත්වාගෙන යෑමඃ ජාතික බාල දක්ෂ / කුඩා මිතුරි වැඩසටහන් සඳහා ගුරුවරුන් පුහුණු කොට මුදල් ප්‍රතිපාදන ලබාදෙන ලදී.
- NBUCRAM ක්‍රමවේදය යටතේ ගුණාත්මක යෙදවුම් සඳහා මුදල් ලබාදීමඃ ජාතික පාසල්වල ප්‍රාථමික අංශ සඳහා අවශ්‍ය වන අධ්‍යාපන ගුණාත්මක යෙදවුම් මිලදී ගැනීම සඳහා මෙම මුදල් ලබාදෙන ලදී.
- ලී බඩු හා උපකරණ ලබාදීම ඃ ජාතික පාසල්වල ප්‍රාථමික පංති කාමරවලට අවශ්‍ය ලී බඩු හා උපකරණ ලබාදීම සඳහා අවශ්‍ය ලේඛන සකස් කොට, භාණ්ඩ ලබාදීමට කටයුතු කරන ලදී.
- ගොඩනැගිලි සෑදීමට සහ අලුත්වැඩියාවන්ට මුදල් ලබාදීමඃ ඉල්ලීම් අනුව ජාතික පාසල්වල නව ගොඩනැගිලි සෑදීමට හා අලුත්වැඩියාවට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් කර දෙන ලදී.

## 3.2. විද්‍යා අධ්‍යාපනය

විද්‍යාත්මක සාක්ෂරතාවය සහිත සිසු පරපුරක් බිහි කිරීමේ අභිමතාර්ථය සහිතව විද්‍යා අධ්‍යාපනය ඉදිරියට ගෙන යන ලද අතර, පහත දැක්වෙන්නේ ඒ සඳහා ක්‍රියාවට නංවන ලද ක්‍රියාකාරකම් සමහරකි.

- විද්‍යා අධ්‍යාපනයට සම්බන්ධ නිලධාරීන්ගේ ධාරිතාවය ඉහළ නැංවීම.

  කලාප හා පළාත් මට්ටම් නිලධාරීන් හා ගුරුවරුන් 3500 ක් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

- ප්‍රතිකාර්ය අධ්‍යාපන වැඩසටහන්

  විද්‍යාව විෂය පිළිබඳ ප්‍රතිකාර්ය අධ්‍යාපන වැඩසටහන් 10 මුළු දිවයිනම ආවරණය වන පරිදි පවත්වන ලදී.
- ක්ෂේත්‍ර මධ්‍යස්ථාන සංවර්ධනය

  සියලු ම ක්ෂේත්‍ර මධ්‍යස්ථාන කළමනාකරුවන් පුහුණු කරවන ලද අතර, සිසුන් සඳහා ද ක්ෂේත්‍ර වැඩමුළු කිහිපයක් පැවැත්විණ.
- විද්‍යාගාර සඳහා උපකරණ හා රසායන ද්‍රව්‍ය ලබාදීම

  සියලු ම 1 AB පාසල් සඳහා විද්‍යා උපකරණ හා රසායන ද්‍රව්‍ය සපයන ලදී.
- ජාතික ගණිත හා විද්‍යා ඔලිම්පියාඩ් තරගය ඃ පහ වසර ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළම ලකුණු ලබා ගත් සිසුන් 500 ක් අතුරෙන්, දක්ෂතම සිසුන් ක්‍රමානුකූල ව තෝරා ගෙන ජාත්‍යන්තර තරගයට ඉදිරිපත් කරන ලදී. පදක්කම් 03 ක් හිමි විය.

## 3.3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය ළමුන් අතර ව්‍යාප්ත කිරීමට දැඩි උත්සාහයක් ගත් අතර, ඒ පිළිබඳ ගනු ලැබූ ප්‍රධාන පියවර පහත දැක්වේ.

- 2007 වර්ෂයේ දී හඳුන්වා දුන් දෘඩාංග හා ජාලකරණ විසඳුම් කණ්ඩායම් පිහිටුවීමේ වැඩසටහන යටතේ පාසල් පරිගණක විද්‍යාගාරවල පවතින දෘඩාංග ගැටළු විසදීම සඳහා පාසල් මට්ටමින් දෘඩාංග සංචිත පිහිටුවීම සහ ඔවුන් මගින් පාසල් පරිගණක විද්‍යාගාරවල දෘඩාංග හා ජාලගත ගැටළු විසඳීම. පාසල් 260 ක දෘඩාංග සංචිත පිහිටුවන ලදී.
- දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනයට දායකත්වය සැපයීමඃ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ආශ්‍රිත වැඩසටහන් පිළිබඳ ප්‍රදර්ශන කුටියක් දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ ඉදිරිපත් කරන ලදී.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණ වැඩසටහන් (IT/BPO) පාසල් සිසුන් හා පාසල් හැර ගිය සිසුන් සඳහා පැවැත්වීමඃ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ආශ්‍රිත කර්මාන්තකරුවන්ගෙන් සැදුම්ලත් කණ්ඩායම් මගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහය ඇති ව පාසල් සිසුන් හා පාසල් හැර ගිය සිසුන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපාර පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් ඒ සම්බන්ධ වැඩමුළු, ප්‍රදර්ශන, සම්මන්ත්‍රණ හා උපදේශන වැඩසටහන් පළාත් මට්ටමින් මෙන්ම දිස්ත්‍රික්ක පදනම් කර ගනිමින් ද පවත්වන ලදී. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ජාතික මට්ටමේ සම්මන්ත්‍රණයක් පැවැත්වින.
- Interactive White Board ව්‍යාපෘතියඃ කැනඩාවේ Smart Technologies ආයතනය මගින් නිෂ්පාදනය කරනු ලබන SMART වර්ගයේ Interactive White Board 09 ක් ප්‍රදානයක් වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට ලබාදෙන ලදී. මෙම උපකරණ පළාත් නියෝජනය වන පරිදි තෝරා ගන්නා ලද ප්‍රමුඛ පෙළේ පාසල් 08 කට හා රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය වෙත ලබා දෙන ලදී.
- එසේ ම මෙම උපකරණ භාවිත කිරීම පිළිබඳ පුහුණුව ද අදාළ උපකරණ ප්‍රදානය කළ ආයතනය මගින් නම් කළ විදේශීය පුහුණුකරුවකු මගින් සිදු කරන ලදී. මෙම උපකරණය මේ වන විට ඉතා සාර්ථක ව එම පාසල්වල හා විද්‍යා පීඨය තුළ ක්‍රියාත්මක වන අතර, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයට අමතරව අනෙකුත් විෂයයන් උගන්වන ගුරුවරුන් ද මේ සම්බන්ධයෙන් පුහුණු කිරීම හා සිසුන්ගේ පරිහරණය සඳහා අවශ්‍ය විෂයානුබද්ධ මෘදුකාංග නිපදවීම අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා

සන්නිවේදන තාක්ෂණ ශාඛාව මගින් සිදු කරනු ලැබේ.

- ප්‍රාථමික පාසල් සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වාදීමට අදාළ ව විෂයය අන්තර්ගත සකස් කිරීම ආරම්භ කිරීම හා ඒ සඳහා කණ්ඩායමක් පිහිටුවීම: තොරතුරු තාක්ෂණය හා අදාළ විෂයයන්හි ප්‍රවීන ගුරුවරුන් මෙන් ම ප්‍රාථමික ගුරුවරුන්ගෙන් සැදුම්ලත් 14 දෙනෙකුගෙන් යුතු සංචිතයක් මේ සඳහා පිහිටුවන ලදී. 1- 5 ශ්‍රේණි සඳහා ගණිතය හා මව්බස සඳහා විෂයය අන්තර්ගත සකස් කිරීම අවසන් කොට ඇත.

## 3.4. ඉංග්‍රීසි භාෂාව

ජාත්‍යන්තර භාෂාවක් වන ඉංග්‍රීසි භාෂාව සාර්ථක ව පාසල් තුළ ඉගැන්වීමට අවශ්‍ය පියවර මෙම වසරේ ද ගෙන ඇත.

- නේවාසික පහසුකම් ද ඇති ගුරු පුහුණු මධ්‍යස්ථාන (RESC) දෙකක් මෙම වසරේ පිහිටුවන ලදී.
- අලුතින් පත්කරන ලද උපාධිධාරී ගුරුවරුන් සඳහා කාර්යක්ෂමතා පුහුණුව ලබා දී, දුෂ්කර පාසල් වෙත ඔවුන් යොමු කරනු ලැබීය.
- ජාතික මට්ටමේ ඉංග්‍රීසි කඳවුරු හා තරග පවත්වා ඇත. ජයග්‍රාහී සිසුන්ට සහතික පත් නිකුත් කරන ලදී.
- සාමාන්‍ය පෙළ විභාගයේ ඉංග්‍රීසි විෂය පිළිබඳ සාමාර්ථ ඉහළ මට්ටමකට නැංවීම සඳහා පුහුණු වැඩසටහන්, උපකරණ හා මුදල් ප්‍රතිපාදන බෙදාදීම හා මගපෙන්වීම ලබාදෙන ලදී.
- පේරාදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට උපකරණ ලබාදීම ද මෙම වසර තුළ සිදුවිය.

## 3.5. ද්විභාෂා අධ්‍යාපනය

ද්විභාෂා වැඩ සටහන සහිත පාසල් සංඛ්‍යාව වැඩි කිරීම මගින් ද්විභාෂා අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා වැඩි කිරීමට පියවර ගන්නා ලදී. වර්ෂය තුළ ජාතික පාසල් 192, පළාත් පාසල් 318 සහ අනුමත පෞද්ගලික පාසල් 37 ක් වශයෙන් පාසල් 547 ක්, ද්විභාෂා අධ්‍යාපන වැඩසටහනට එක් විය.

මීට අමතර ව, 2009 - 2011 තුන් අවුරුදු කාලසීමාවන් සඳහා ද්විභාෂා අධ්‍යාපන වැඩසටහන පිළිබඳ ජාතික සැලැස්මක් සකස් කරන ලදී.

විද්‍යා විෂය ධාරාවට අමතර ව වාණිජ හා කලා විෂය ධාරාවන් හි තෝරා ගත් විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම සඳහා අමාත්‍ය මණ්ඩල අවසර ලබාගැන්ම ද මෙම වසර තුළ ඉටු වුණු විශේෂ කාර්යයකි.

## 3.6. ආගමික හා සාරධර්ම අධ්‍යාපනය

සියලු ම පාසල් සිසුන් තුළ ආගමික අධ්‍යාපනය හා සාරධර්ම ඉහළ නැංවීම මෙම වර්ෂයේ ප්‍රධාන ඉලක්කය විය. ඒ සඳහා "සාරධර්මයාය සිසු සැරිසරන" වැඩසටහන, සියලු පාසල් සිසුන් ආවරණය වන පරිදි දීපව්‍යාප්ත ව ක්‍රියාත්මක කරන ලදී. එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට මූලික ව කටයුතු කරන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, විෂය අධ්‍යක්ෂවරුන්, විදුහල්පතිවරුන්, ගුරු උපදේශකවරුන් හා ආගමික විෂය උගන්වන ගුරුවරුන් දැනුවත් කිරීම වැදගත් ක්‍රියාකාරකමක් විය.

## 3.7. සිංහල භාෂාව

දුෂ්කර පාසල් සිසුන්ගේ අ.පො.ස.(සා.පෙළ)සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය ප්‍රතිඵල 10% කින් ඉහළ නැංවීම ඉලක්ක කොට ගත් විශේෂ වැඩසටහනක් ක්‍රියාවට නංවන ලදී. ඒ යටතේ සියලු ම පළාත්වල දුෂ්කර පාසල් ගුරුවරුන්ගේ භාෂා හැකියා වර්ධනය කිරීමට පියවර ගත් අතර, විභාග ප්‍රතිඵලවල දියුණුවක් දක්නට හැකි විය. සිංහල මාධ්‍ය පාසල් සිසුන්ගේ චතුර්විධ භාෂා කුසලතා දියුණුකිරීම සඳහා සිංහල භාෂාව හා සාහිත්‍යය තරගාවලියක් පාසල්, කලාප, පළාත් හා ජාතික මට්ටම් වලින් පවත්වා ජයග්‍රාහකයන්ට සහතික, පදක්කම් හා ත්‍යාග පිරිනමන ලදී.

## 3.8. දෙමළ භාෂාව

සිසුන්ගේ භාෂා මට්ටම දියුණු කිරීම හා විභාගවල දී සාධනය ඉහළ නැංවීම මෙම වසරේ ප්‍රධාන ඉලක්ක විය. ඒ සඳහා පාසල්, කලාප, පළාත් සහ ජාතික මට්ටම් වලින් තරග පවත්වන ලද අතර, ජයග්‍රාහිකයන්ට පදක්කම් හා සහතික පිරිනමන ලදී.

සිසුන්ගේ භාෂා කුසලතා ඉහළ නැංවීම සඳහා වාර්ෂික ව පළ කරන "කූර්මතී" අධ්‍යාපනික සඟරාව මෙම වසරේ ද පළ කොට සියලු ම දෙමළ මාධ්‍ය පාසල්වලට පිටපත් නිකුත් කරන ලදී.

## 3.9. සෞන්දර්ය අධ්‍යාපනය

ශිෂ්‍ය කුසලතා සංවර්ධනය හා විෂය ප්‍රතිඵල ඉහළ නැංවීම ඉලක්ක කොටගත් වැඩ සටහන් කිහිපයක් මෙම වසර තුළ ක්‍රියාත්මක විය.

- චිත්‍ර කලාව, නර්තනය (සිංහල/දෙමළ), සංගීතය (පෙරදිග/බටහිර) හා නාට්‍ය රංග කලාව යන විෂයන්හි ද ප්‍රතිඵල, පෙර වසරට වඩා 5% න් ඉහළ නැංවීම සඳහා ගුරු තත්ත්ව කව, සම්මන්ත්‍රණ, ශිෂ්‍ය කඳවුරු හා විශේෂ සාකච්ඡා උපයෝගී කර ගන්නා ලදී. මේ මගින් වසරේ ප්‍රතිඵල 4.3% න් ඉහළ නැංවීමට හැකි විය.
- කුසලතා ප්‍රදර්ශනය තුළින් ශිෂ්‍ය කුසලතා සංවර්ධනය කිරීමට පියවර ගන්නා ලද අතර, සිසුන් 2100 කගේ හිස් වෙස් තබා කළඑළි නැංවීමට හැකි විය.
- නර්තනය, සංගීතය, චිත්‍ර කලාව, රංග කලාව හා බටහිර සංගීතය යන විෂයයන්වලට අදාලව සමස්ත ලංකා තරග පැවැත්වීමට හැකි වූ අතර ඒ තුලින් සිසු කුසලතා සංවර්ධනයක් කරනු ලැබීය. චිත්‍ර කලා සිසුන් 1200 ක්, නර්තන සිසුන් 9300 ක්, සංගීත සිසුන් 5100 ක්, නාට්‍ය හා රංග කලා සිසුන් 800 ක් හා බටහිර සංගීත සිසුන් 450 ක් ඇතුළත් කරමින්, සුවිශේෂ දක්ෂතා සහිත සිසුන්ට සහතික පත් ප්‍රදානය කරන ලදී.
- විදුහල්පතිවරුන් කරන ලද ඉල්ලීම් අනුව චිත්‍ර, නැටුම්, සංගීත යන විෂයයන් සඳහා සෞන්දර්ය උපකරණ බෙදාදෙන ලද අතර, මේ සඳහා රුපියල් මිලියන 20 ක් වැය විය. ඒ ඒ විෂයයන් සඳහා උපකරණ ලබාගත් පාසල් සංඛ්‍යාව මෙසේය.

| විෂය | උපකරණ ලබා දුන් පාසල් සංඛ්‍යාව |
|---|---|
| **චිත්‍ර කලා** | 150 |
| **නැටුම් විෂය** | 50 |
| **සංගීත විෂය** | 50 |
| **බටහිර සංගීතය** | 15 |

### 3.10. ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය

සිසුන්ගේ පූර්ණ වර්ධනය සඳහා උපයෝගී වන ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන කටයුතු කෙරෙහි විශේෂ අවධානය මෙම වසර තුළ ද යොමු විය.

- සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂය තවදුරටත් පාසල තුළ ඉගැන්වේ. ඒ සඳහා අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම ජාතික පාසල්වලට ලබා දී ඇත.
- ප්‍රාථමික මෙන් ම ද්විතීයික පාසල්වලට ක්‍රීඩා උපකරණ මිල දී ගැනීම සඳහා පිරිවිතර සකස් කරන ලද අතර, ඒ අනුව මිල දී ගත් උපකරණ පාසල්වලට බෙදාදෙන ලදී.
- ක්‍රීඩා පාසල් ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යනු ලැබීය. ඒ තුළින් දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කුසලතා තවදුරටත් සංවර්ධන කරනු ලැබේ. එම පාසල්වලට මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමත්, පාසල් කටයුතු ඇගයීමට ලක් කිරීමත් මෙම වසරේ ද සිදු විය.
- කොට්ඨාස, කලාප හා පළාත් ක්‍රීඩා තරග වලින් ජය ලැබූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා තවදුරටත් ඔප් නැංවීම සඳහා සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරගය පවත්වන ලද අතර, තෝරා ගත් සිසු සිසුවියන්ට ජාත්‍යන්තර තලයේ තරගවලට ඉදිරිපත් වීමට අවකාශයක් සලසා දෙන ලදී.
- විදේශ රටවලින් ලැබෙන ආරාධනා අනුව පුහුණු කඳවුරු හා තරගවලට සිසුන් හා ගුරුභවතුන් සහභාගි කරවීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
- සමස්ත ලංකා ගුරු ක්‍රීඩා තරගය පැවැත්වීම සඳහා අවශ්‍ය විධි විධාන යොදන ලද අතර, ලබන වසර මුල එම තරගය පැවැත්වීමට පියවර ගෙන ඇත.

### 3.11. වතු පාසල් සංවර්ධනය

වතු පාසල්වල භෞතික සංවර්ධනය ගැන මෙන් ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය ගැන විශේෂ සැලකිල්ලක් දක්වන ලදී. වතු පාසල් බෙහෙවින් විසිරී ඇති පළාත්වල ක්‍රියාවට නංවන ලද වැඩ සටහන් සමහරක් මෙසේය:

- වතු පාසල් සිසුන්ගේ විද්‍යාව, ගණිතය හා ඉංග්‍රීසි විෂයයන්ගේ ප්‍රතිඵල වර්ධනය ඉලක්ක කොට ගෙන මධ්‍යම පළාතේ එම විෂයයන් උගන්වන ගුරුවරුන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා ගුරු පුහුණු වැඩමුළු 07 ක් පැවැත්වීම,
- වතු පාසල්වල අ.පො.ස. (උ.පෙ) සිසුන්ගේ විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා, මධ්‍යම, ඌව, සබරගමුව, බස්නාහිර, දකුණ හා වයඹ යන පළාත්වල විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි, ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව හා ඉතිහාසය උගන්වන ගුරුවරුන් සඳහා වැඩමුළු 64 ක් පැවැත්වීම.

### 3.12. මුස්ලිම් පාසල් සංවර්ධනය

- ජාතික අධ්‍යාපන අරමුණු තුළ මුස්ලිම් ජාතික අනන්‍යතාවයන් ආරක්ෂා කරගනිමින් මුස්ලිම් පාසල් ප්‍රවර්ධනය සඳහා පියවර ගෙන ඇත.
- මුස්ලිම් අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යෑමට අවශ්‍ය තොරතුරු මෙම වසර තුළ එක් රැස්කර ගන්නා ලදී. එසේ ම මෞලවි ගුරු පත්වීම් ලබාදීමට අවශ්‍ය තොරතුරු අදාළ ශාඛා වෙත යොමු කිරීමත්, යුද සමයේ අවතැන්වූ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු විධිමත් ව සකස් කිරීමත්, මුස්ලිම් පාසල් සඳහා අදාළ පාසල් වාර දින දර්ශන සකස් කර බෙදාදීමත්, පාසල් බාහිර ඇගයීම් ක්‍රියාත්මක කිරීමත්, මෙම වසර තුළ ඉටු වූ ප්‍රධාන කාර්යයන්ය.

## 3.13. අධ්‍යාපනයේ ගුණාත්මක බව තහවුරු කිරීම

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් ව පවත්වාගෙන යෑම සඳහා පාසල්වලට උපකාරී වනු වස් අමාත්‍යාංශ මට්ටමින් අධීක්ෂණ කටයුතු පවත්වාගෙන යනු ලැබේ. ප්‍රමිති සකස් කිරීම ඒ පිළිබඳ දැනුවත් කිරීම හා කළමනාකරණය ශක්තිමත් කිරීම මේ සඳහා උපයෝගී කර ගන්නා ක්‍රමවේද කිහිපයකි.

- ප්‍රමිති පදනම් කරගත් නව ඇගයීම් නියාමන යාන්ත්‍රණය හඳුන්වාදීම හා ශක්තිමත් කිරීම: මේ සඳහා විදුහල්පතිවරුන් හා පාසල් කළමනාකරණ කමිටු සාමාජිකයින් සඳහා වැඩමුළු 06 ක් පවත්වන ලද අතර, 751 ක් පුහුණුවට භාජනය විය.
- 2008/06 චක්‍රලේඛය විෂය අධ්‍යක්ෂවරුන් වෙත හඳුන්වා දීම: ගුරු උපදේශකවරුන් හා ගුරුවරුන් 233 සඳහා වැඩමුළු 7 ක් පවත්වන ලදී.
- පළාත් පාසල් දැනුවත් කිරීම: විදුහල්පතිවරුන් 178 ක් දැනුවත් කිරීම සඳහා රැස්වීම් 8 ක් පවත්වන ලදී.
- ගුරු උපදේශක නිපුනතා හඳුන්වා දීම: ගුරු උපදේශකවරුන් හා ගුරුවරුන් 44 ක් සඳහා එක් වැඩමුළුවක් පවත්වා, ගුරු උපදේශක නිපුණතා පිළිබඳ ව ඔවුන් දැනුවත් කරන ලදී.


## 3.14. අධ්‍යාපන සාධනය පිළිබඳ ප්‍රවනතා

අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා ගන්නා ලද උත්සාහයන්ගේ ඵලය මැනෙන එක් දර්ශකයකි, ප්‍රසිද්ධ විභාග. ඉන් එක් ප්‍රසිද්ධ විභාගයක් වන 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල විශ්ලේෂණයක් 3.14.1. වගුවෙන් හා 3.14.1. ප්‍රස්තාරයෙන් දැක්වේ.

**වගුව 3.14.1. : 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල මාධ්‍ය අනුව - 2008**

| වර්ෂය | විභාගයට පෙනී සිටි මුළු සංඛ්‍යාව | | | 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2008 ලකුණු 70ට ඉහළින් ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | විභාගයට පෙනී සිටි මුළු සංඛ්‍යාව | සිංහල මාධ්‍ය | | දෙමළ මාධ්‍ය | | මුළු | |
| | | | | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| 2008 | 211,004 | 64,117 | 275,121 | 88,414 | 41.90 | 20,130 | 31.40 | 108,544 | 39.45 |

**ප්‍රස්තාරය : 3.14.1. 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2008 ලකුණු 70 ට ඉහළින් ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය**




අධ්‍යාපනයේ ගුණාත්මක භාවයේ ඵලය මැනෙන තවත් දර්ශකයක් වන්නේ අ.පො.ස. (සා.පෙ) විභාගයයි. 2006 - 2008 අතර (සා.පෙ.) ප්‍රතිඵල සංසන්දනයන් වගු හා ප්‍රස්තාර 3.14.2., 3.14.3. හා 3.13.4. හි දැක්වේ.

වගුව 3.14.2. : අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 2006 - 2008

| විෂය | 2006 | 2007 | 2008 |
|---|---|---|---|
| ඉංග්‍රීසි | 95,356 | 110,227 | 86,224 |
| ගණිතය | 110,519 | 134,053 | 136,909 |
| විද්‍යාව | 125,212 | 132,564 | 133,088 |


ප්‍රස්තාරය : 3.14.2. : අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 2006 - 2008




වගුව : 3.14.3. : අ.පො.ස. (සා.පෙ) විභාගය 2008 ප්‍රධාන විෂයයන් අනුව සමත් ශිෂ්‍ය ප්‍රතිශතය

| විෂය | සමත් ශිෂ්‍ය ප්‍රතිශතය |
|---|---|
| සිංහල | 81% |
| දෙමළ | 75% |
| ඉංග්‍රීසි | 31% |
| ගණිතය | 51% |
| විද්‍යාව | 47% |
| තො. තාක්ෂණය | 88% |


ප්‍රස්තාරය : 3.14.3. : අ.පො.ස. (සා.පෙ) විභාගය 2008 ප්‍රධාන විෂයයන් අනුව සමත් ශිෂ්‍ය ප්‍රතිශතය



**වගුව : 3.14.4. : අ.පො.ස. (සා.පෙ) විභාගය 2008 ප්‍රධාන විෂයයන් අනුව විභාගයට පෙනී සිටි හා සමත් ශිෂ්‍ය සංඛ්‍යාව**

| විෂය | විභාගයට පෙනී සිටි සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව |
|---|---|---|
| සිංහල | 223,793 | 181,921 |
| දෙමළ | 57,864 | 43,427 |
| ඉංග්‍රීසි | 281,136 | 86,224 |
| ගණිතය | 268,133 | 136,909 |
| විද්‍යාව | 280,718 | 133,088 |
| තො. තාක්ෂණය | 38,759 | 33,930 |

**ප්‍රස්තාරය : 3.14.4. : අ.පො.ස. (සා.පෙ) විභාගය 2008 ප්‍රධාන විෂයයන් අනුව විභාගයට පෙනී සිටි හා සමත් ශිෂ්‍ය සංඛ්‍යාව**





ප්‍රස්තාර 3.14.5. හා 3.14.6. හි දැක්වෙන්නේ 2008, අ.පො.ස. (උ.පෙ.) ප්‍රතිඵල විග්‍රහයකි. විද්‍යා හා ගණිත විෂය ධාරාවන් ගැන වැඩි අවධානයක් අධ්‍යාපන ක්‍රමය තුළ තිබිය යුතු බව මින් පැහැදිළි වේ.

**වගුව : 3.14.5. : අ.පො.ස. (උ.පෙ) විෂය ධාරාව අනුව විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලද ශිෂ්‍ය සංඛ්‍යාව 2008**

| විෂය | විභාගයට පෙනී සිටි සංඛ්‍යාව | වි.වි. ප්‍රවේශය සඳහා සුදුසුකම් ලද සංඛ්‍යාව |
|---|---|---|
| විද්‍යා අංශය | 18,928 | 6,696 |
| ගණිත අංශය | 13,814 | 4,680 |
| වාණිජ අංශය | 36,772 | 23,261 |
| කලා අංශය | 59,048 | 40,353 |


ප්‍රස්තාරය ⁝ 3.14.5. ⁝ අ.පො.ස. (උ.පෙ) විෂය ධාරාව අනුව විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලද ශිෂ්‍ය සංඛ්‍යාව 2008




වගුව 3.14.6. ⁝ අ.පො.ස. (උ/පෙ) විෂය ධාරාව අනුව විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලද ශිෂ්‍ය ප්‍රතිශතය 2005 - 2008

| වර්ෂය | විද්‍යා අංශය | ගණිත අංශය | වාණිජ අංශය | කලා අංශය |
|---|---|---|---|---|
| 2005 | 32.86 % | 34.03 % | 56.4 % | 60.55 % |
| 2006 | 33 % | 32.97 % | 62.15 % | 63.01 % |
| 2007 | 34.87 % | 33.42 % | 61.24 % | 65.31 % |
| 2008 | 35.38 % | 33.88 % | 63.26 % | 68.34 % |

ප්‍රස්තාරය 3.14.6. ⁝ අ.පො.ස. (උ/පෙ) විෂය ධාරාව අනුව විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලද ශිෂ්‍ය ප්‍රතිශතය 2005 - 2008



# පරිච්ඡේදය 4: මානව සම්පත් සැපයීම හා සංවර්ධනය

අධ්‍යාපනය සැපයීම සඳහා අවශ්‍ය මානව සම්පත අති විශාල වන අතර, එම මානව සම්පතේ ධාරිතාවය ඉහළ මට්ටමක පැවතීම ඉතා වැදගත් ය. ඒ අනුව 2008 වර්ෂය මානව සම්පත් සැපයීම හා සංවර්ධනය සඳහා විශේෂ අවධානය යොමු කරන ලදී.

## 4.1. උපාධිධාරී හා උපාධිධාරී නොවන ගුරුවරුන් බඳවා ගැනීම


2008 වර්ෂය තුළ ජාතික පාසල් සඳහා ජාතික ශික්ෂණ ඩිප්ලෝමාධාරීන් 427 ක් බඳවා ගන්නා ලද අතර, පළාත් පාසල්වල සේවය සඳහා නවක ජාතික ශික්ෂණ ඩිප්ලෝමාධාරී ගුරුවරුන් 2,191 සපයන ලදී. 2005 - 2008 කාලය තුළ රජයේ පාසල් සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේ වර්ධනය පහත සඳහන් වගුවේ දැක්වේ.

**වගුව 4.1.1. : උපාධිධාරී හා උපාධිධාරී නොවන ගුරුවරුන් බඳවා ගැනීම (2005 – 2008)**

| වර්ෂය | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගුරුවරුන් බඳවා ගැනීම | | | | පළාත් සභා විසින් උපාධිධාරීන් බඳවා ගැනීම | |
|---|---|---|---|---|---|---|
| | *ජාතික පාසල් සඳහා* | | *පළාත් සභා පාසල් සඳහා* | | | |
| | *උපාධිධාරී* | *ජාතික ශික්ෂණ ඩිප්ලෝමාධාරීන්* | *උපාධිධාරී* | *ජාතික ශික්ෂණ ඩිප්ලෝමාධාරීන්* | *ගුරු පත්වීම්* | *වෙනත් පත්වීම්* |
| **2005** | 2,923 | 383 | 326 | 2,326 | 1,925 | -- |
| **2006** | 2,444 | 887 | 960 | 2,451 | 2,960 | -- |
| **2007** | -- | 408 | 1,490 | 2,191 | 967 | 321 |
| **2008** | -- | 427 | 671 | 2,191 | 3,070 | 1,119 |

*මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශ*

**ප්‍රස්තාරය 4.1.1. : රජයේ පාසල්වල ගුරු සංඛ්‍යාවේ වර්ධනය 2005 - 2008**




*මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය*

ගුරුවරුන් ප්‍රමාණවත් පරිදි බඳවා ගැනීම් සිදු වුව ද, පාසල් අතර බෙදාහැරීමේ දී හා සමහර පාසල්වල නිශ්චිත විෂයයන් අනුව ගුරු හිඟය තවදුරටත් පවතින බව පෙනේ.

**වගුව 4.1.2: දළ ශිෂ්‍ය ගුරු අනුපාතය දිස්ත්‍රික්ක අනුව**

| දිස්ත්‍රික්කය | ශිෂ්‍ය /උපාධිගුරු අනුපාතය | ශිෂ්‍ය / පුහුණු ගුරු අනුපාතය | ශිෂ්‍ය නුපුහුණු ගුරු අනුපාතය | සමස්ත ශිෂ්‍ය / ගුරු අනුපාතය |
|---|---|---|---|---|
| කොළඹ | 49.84 | 40.58 | 2119.08 | 22.13 |
| ගම්පහ | 55.02 | 37.55 | 3035.27 | 22.16 |
| කළුතර | 53.00 | 34.52 | 988.23 | 20.47 |
| මහනුවර | 47.95 | 26.50 | 376.82 | 16.33 |
| මාතලේ | 42.32 | 25.19 | 343.55 | 15.10 |
| නුවරඑළිය | 72.17 | 30.33 | 101.27 | 17.64 |
| ගාල්ල | 51.53 | 30.33 | 1687.92 | 18.88 |
| මාතර | 36.44 | 30.29 | 1497.60 | 16.36 |
| හම්බන්තොට | 40.72 | 26.39 | 996.99 | 15.76 |
| යාපනය | 43.04 | 33.66 | 1519.75 | 18.66 |
| කිලිනොච්චිය | 138.55 | 43.62 | 509.31 | 31.15 |
| මන්නාරම | 80.76 | 40.38 | 366.05 | 25.08 |
| මුලතිව් | 114.72 | 43.62 | 358.51 | 29.04 |
| වව්නියාව | 69.02 | 26.50 | 596.13 | 18.55 |
| අම්පාර | 79.34 | 27.38 | 451.56 | 19.48 |
| මඩකලපුව | 66.62 | 37.03 | 1196.68 | 23.34 |
| ත්‍රිකුණාමලය | 107.93 | 30.91 | 701.57 | 23.23 |
| කුරුණෑගල | 40.96 | 25.09 | 1118.86 | 15.34 |
| පුත්තලම | 77.40 | 34.74 | 895.72 | 23.35 |
| අනුරාධපුර | 66.12 | 26.67 | 144.84 | 16.80 |
| පොලොන්නරුව | 83.62 | 32.92 | 183.14 | 20.92 |
| බදුල්ල | 56.70 | 24.56 | 156.07 | 15.44 |
| මොණරාගල | 61.19 | 29.47 | 166.36 | 17.77 |
| කෑගල්ල | 45.94 | 24.51 | 492.66 | 15.48 |
| රත්නපුර | 48.33 | 29.89 | 547.65 | 17.87 |
| ශ්‍රී ලංකාව | 53.37 | 30.27 | 441.54 | 18.50 |

*මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය*

## 4.2. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල හා ගුරු විද්‍යාලවල සිදු කරන ආයතනික ගුරු පුහුණුව

සෑම ගුරුවරයෙකු ම පුහුණු ගුරුවරයෙකු බවට පත් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ අභිලාෂයයි. මේ සඳහා ක්‍රමවේද කිහිපයක් අනුගමනය කරනු ලැබේ.

### 4.2.1. ගුරු බඳවා ගැනීම

නවක ගුරු සිසුන් බඳවාගනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ය. අධ්‍යාපන විද්‍යාපීඨවල දී ඔවුහු තුන් අවුරුදු පුහුණුවක් ලබති. අනතුරුව ඔවුන් ජාතික පාසල් වෙත හා පළාත් සභා යටතේ ඇති පාසල් වෙත යොමු කරනු ලැබේ. උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීමේ අවකාශය අධ්‍යාපන අමාත්‍යාංශයට මෙන් ම පළාත් සභාවලට ද ඇත. මෙම උපාධිධාරීන් පුහුණු ගුරුවරුන් බවට පත් කිරීම සඳහා විශ්ව විද්‍යාල හා ජාතික

අධ්‍යාපන ආයතන මගින් පවත්වනු ලබන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවක් වෙත යොමු කරනු ලැබේ.

උපාධිධාරීන් නොවන නුපුහුණු ගුරුවරුන් ගුරු විද්‍යාලවල දී මෙන් ම දුරස්ථ පාඨමාලාවල දී පුහුණු කිරීමට කටයුතු කරනු ලැබීය.

### 4.2.2. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ මගින් සිදු කරන ආයතනික ගුරු පුහුණුව සහ වෙනත් වැඩසටහන්

- 2008 වසර තුළ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට නවක ගුරු සිසුන් 3,000 ක් බඳවා ගන්නා ලදී.
- තෙවසර පුහුණුව අවසන් කළ ගුරු සිසුන් සඳහා ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පවත්වා එම ඩිප්ලෝමා සහතික පත් ලබාදෙන ලදී.
- නුපුහුණු උපාධිධාරීන් පුහුණු උපාධිධාරීන් ලෙස සංවර්ධනය කිරීම සඳහා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම පිණිස විශ්ව විද්‍යාල වෙත යොමු කරනු ලැබීය.
- ගුරු සිසුන්ගේ සන්නිවේදන කුසලතා සහ නිර්මාණ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා අන්තර් විද්‍යාපීඨ සඟරාව පළ කරන ලදී.
- තොරතුරු සන්නිවේදන තාක්ෂණයට අදාළ දැනුම සහ ප්‍රායෝගික හැකියාවන් වර්ධනය කිරීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ ප්‍රදර්ශනයක් රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ දී පැවැත්විණ.
- විද්‍යාපීඨ කථිකාචාර්යවරුන් 500 කට හා ගුරු සිසුන් 3,500 කට තොරතුරු තාක්ෂණයේ මූලිකාංග හඳුන්වාදීම සඳහා පුහුණු සැසි (INTEL වැඩ සටහන) පවත්වන ලදී.
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ කථිකාචාර්යවරුන් කාර්ය මූල පර්යේෂණ වෙත යොමු කරන ලදී.

### 4.2.3. නව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ආරම්භය

මෙම වසරේ පේරාදෙණිය ගුරු විද්‍යාලයය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් ලෙස තාවකාලික ව ස්ථාපිත කරන ලද අතර, එහිදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ වෘත්තියවේදීන්ගේ නිපුනතාවයන් වැඩිදියුණු කිරීමට අපේක්ෂිත ය.

## 4.3. අධ්‍යාපන කළමනාකරණ හා නායකත්ව සංවර්ධනය

මෙම වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන් අතර

- මානව සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීම සහ ඒ පිළිබඳ ව අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන් දැනුවත් කිරීම,
- අධ්‍යාපන අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීමේ පියවරක් ලෙස ඉහළ කළමනාකරණ ස්ථරවල රැකියා විස්තර සකස් කිරීම ප්‍රධාන තැනක් ගනී.

මීට අමතර ව නිලධාරීන් හා වෙනත් සේවකයන් විදේශීය මෙන් ම දේශීය පුහුණු සඳහා යොමු කළ අතර, ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

**වගුව 4.3.1. නිලධාරීන් සඳහා දේශීය හා විදේශීය පුහුණු**

| කාර්යය | පුහුණු ක්ෂේත්‍රය | සංඛ්‍යාව |
|---|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය / පළාත් - මානව සම්පත් සංවර්ධනය - විදේශීය | අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය හා මානව සම්පත් තොරතුරු පද්ධතිය පිළිබඳ අධ්‍යයන චාරිකාව | ශ්‍රී.ලං.අ.ප.සේ. නිලධාරීන් - 21<br>ශ්‍රී.ලං.ප.සේ. නිලධාරීන් - 2 |
| | පාසල් නගාසිටුවීමේ වැඩස-ටහන - කෙටිකාලීන | මාණ්ඩලික නිලධාරීන් - 25 |
| පුහුණු හා සංවර්ධනය- දේශීය | ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | ශ්‍රී.ලං. අ.ප.සේ. නිලධාරීන් - 6 |
| | | ශ්‍රී.ලං.ප.සේ. නිලධාරීන් - 21 |
| | | ලිපිකරු හා සමාන්තර සේවා- 17 |
| | කළමනාකරණ විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව | ගණකාධිකාරි - 2 |
| | ශාස්ත්‍රපති | ශ්‍රී.ලං.ප.සේ. නිලධාරීන් - 1 |
| | පශ්චාත් උපාධි පාඨමාලා | ශ්‍රී.ලං.ප.සේ. නිලධාරීන් - 2 |
| | පොත් බැඳුම්කරුවන් පුහුණු කිරීම | කා.කා.ස. සේවකයින් - 4 |
| | පරිගණක ධාවන බලපත්‍ර සහතික පත්‍ර පාඨමාලාව | ලිපිකරු හා සමාන්තර සේවා - 4 |
| | කාර්යාල කාර්ය සහායක පුහුණු වැඩමුළුව | කා.කා.ස. සේවකයින් - 150 |
| | ජාතික පාසල්වල සේවය කරන අනධ්‍යයන සේවක මණ්ඩලය පුහුණු කිරීමේ වැඩසටහන | බස්නාහිර, වයඹ, දකුණ හා සබරගමුව පළාත්වල ජාතික පාසල්වල සේවය කරන පාසල් කම්කරු (ස්ථිර) සේවකයින් 900 සඳහා එක් දින පුහුණු වැඩමුළුවක් |

# පරිච්ඡේද 5ඃ භෞතික පහසුකම් සැපයීම

මෙම පරිච්ඡේදය යටතේ ගොඩනැගිලි ඉදිකිරීමේ හා නඩත්තු කිරීමේ කාර්යයන් මෙන් ම ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ සැපයීම පිළිබඳ තොරතුරු ද දක්වා ඇත.

## 5.1. ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තු කිරීම

මෙම වසර තුළ කරන ලද නව ඉදිකිරීම් සාපේක්ෂ ව 85 ක් වන අතර, ඒ සඳහා රුපියල් මිලියන 920 ක් පමණ වැය විය. අලුත්වැඩියා කරන ලද සංඛ්‍යාව 87 ක් විය. ඒ සඳහා වැය වූ මුදල රුපියල් මිලියන 268 ක් පමණ විය. ප්‍රතිලාභ ලැබූ ආයතන අතර ජාතික පාසල්, පළාත් පාසල්, ගුරු විද්‍යාල, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ මෙන් ම අධ්‍යාපන අමාත්‍යාංශ පරිශ්‍රය ද ඇතුළත්ය. ඉදිකිරීම් හා නඩත්තු පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු පහත දැක්වේ.

| වර්ගය හෝ අයිතමය | අලුතින් ඉදිකරන ලද ගොඩනැගිලි/ අලුත්වැඩියා පිළිබඳ විස්තරය (ව්‍යාපෘති අනුව) | කරන ලද ඉදි කිරීම් සංඛ්‍යාව | වෙන් කල මුදල | වැය කල මුදල | අලුත්වැඩියා කරන ලද සංඛ්‍යාව | වෙන් කල මුදල | වැය කල මුදල |
|---|---|---|---|---|---|---|---|
| ජාතික පාසල් | ප්‍රාථමික අංශ | 8 | 60,000,000.00 | 62,860,000.00 | 10 | 28,000,000.00 | 18,800,000.00 |
| ජාතික පාසල් | ද්විතීයික අංශ | 28 | 525,000,000.00 | 400,252,000.00 | 30 | 205,000,000.00 | 182,630,000.00 |
| පළාත් පාසල් | සියලු පාසල් හදිසි වැඩිදියුණු කිරීම | 4 | 5,000,000.00 | 40,731,485.00 | | | |
| පළාත් පාසල් | නව ආදර්ශ ප්‍රාථමික පාසල් වැඩිදියුණු කිරීම | 4 | 126,000,000.00 | 86,598,548.53 | | | |
| පළාත් පාසල් | තෝරාගත් ප්‍රාථමික පාසල් වැඩිදියුණු කිරීම | 1 | 65,000,000.00 | 37,541,690.33 | | | |
| පළාත් පාසල් | ඉසුරු පාසල් සංවර්ධනය කිරීම | 5 | 100,000,000.00 | 52,523,000.00 | | | |
| ගුරු විද්‍යාල | ප්‍රාදේශීය ඉංග්‍රීසි උපදේශක මධ්‍යස්ථාන ඉදිකිරීම | 13 | 50,000,000.00 | 157,158,006.26 | | | |
| ගුරු විද්‍යාල | ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථාන | 6 | 8,000,000.00 | 11,736,670.32 | 12 | 20,000,000.00 | 31,832,685.80 |
| ජා.අ.වි.පී. | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | 5 | 4,000,000.00 | 12,045,663.58 | 25 | 45,000,000.00 | 22,138,963.60 |
| ජාතික පාසල් | විශේෂ අධ්‍යාපන ඒකක නවීකරණය | | | | 9 | 4,000,000.00 | 2,818,442.00 |
| ජාතික පාසල් | SPACE ව්‍යාපෘතිය | 10 | 14,000,000.00 | 12,145,663.58 | | | |
| ඉසුරුපාය | නව ඉදි කිරීම් | 1 | 47,000,000.00 | 47,000,000.00 | 1 | 12,000,000.00 | 9,739,763.00 |
| | **එකතුව** | 85 | 1,004,000,000.00 | 920,592,727.60 | 87 | 314,000,000.00 | 267,959,854.40 |

## 5.2. ඉගෙනුම් - ඉගැන්වීම් උපකරණ සැපයීම

අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට අවශ්‍ය භෞතික සම්පත් තීරණය කරනු ලබන විෂය අධ්‍යක්ෂවරු විසින් ඉල්ලුම් කරන ඉගෙනුම් උපකාරක ද්‍රව්‍ය ප්‍රසම්පාදන කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ මධ්‍යගත ප්‍රසම්පාදන ඒකකය විසින් ඉටු කරනු ලැබේ. මෙහිදී ප්‍රසම්පාදන ඒකකය විසින් විධිමත් තාක්ෂණික අනුමැතිය ලබාදීමෙන් අනතුරුව අදාළ විෂය අධ්‍යක්ෂවරු විසින් එම ඉගෙනුම් උපකාරක ද්‍රව්‍ය කුමන ජාතික පාසල්, කුමන ප්‍රමාණයෙන් ලබාදිය යුතු දැයි සැපයීම් ශාඛාව වෙත දැනුම් දෙනු ලැබේ. ඇතැම් විද්‍යා උපකරණ හා රසායනික ද්‍රව්‍ය ජාතික පාසල් මෙන් ම පළාත් පාසල් වෙත ද රේඛීය අමාත්‍යාංශය විසින් පමණක් මිල දී ගෙන බෙදා හැරිය යුතු ද්‍රව්‍ය වන බැවින්, එහිදී ජාතික පාසල් වලට අමතර ව පළාත් පාසල් වෙත ද සැපයීම් කරනු ලැබේ.

මෙහිදී කාර්යක්ෂම ක්‍රමවේදයක් ඔස්සේ අවම ඉන්ධන ප්‍රමාණයක් හා අවම වාහන ප්‍රමාණයක් භාවිතා කර ගබඩාකරණයේ පවතින කාලය හැකිතාක්දුරට අවම කර, සිසු දරු දැරියන්ගේ ඉගෙනුම් අවශ්‍යතා සපුරාලීම සඳහා සංවිධානාත්මක හා සැලසුම් සහගත වැඩ පිළිවෙළක් ඔස්සේ අධ්‍යාපන පද්ධතිය වෙත ඉගෙනුම් උපකරණ හා ද්‍රව්‍ය සැපයීමේ කාර්යය ඉටු කිරීම අධ්‍යාපන සේවා සැපයීම් ශාඛාව මගින් සිදු කරනු ලැබේ.

සෞන්දර්ය, ක්‍රීඩා, කෘෂි, තොරතුරු තාක්ෂණ, විශේෂ අධ්‍යාපන හා විද්‍යා ආදි විෂය ක්ෂේත්‍ර ගණනාවක ඉගෙනුම් උපකාරක ද්‍රව්‍ය ජාතික පාසල් පද්ධතිය වෙත බෙදාදීමේ දී එක් එක් විෂය සඳහා නැවත නැවත එකම ස්ථාන වෙත ප්‍රවාහනය කිරීම වෙනුවට, ඉන්ධන හා ප්‍රවාහන පහසුකම් අවම වශයෙන් භාවිතා වන විශේෂ කාර්යක්ෂම ක්‍රමයක් මෙම ක්‍රියාවලිය ඉටු කිරීමේ දී අවශ්‍ය වේ. මේ අතර සංකීර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා තාක්ෂණික ඇගයීම් ක්‍රියාවලිය ප්‍රායෝගික ව එක් එක් විෂය සඳහා වෙන වෙන ම සිදු කෙරේ. එබැවින්, ඉහත සඳහන් කළ පරිදි අවම ප්‍රතිපාදන ප්‍රමාණයෙන් උපරිම අන්දමින් ප්‍රවාහනය සඳහා අනුගමනය කෙරෙන විශේෂ ක්‍රමෝපායයන් වශයෙන් සියලු ම විෂය අධ්‍යක්ෂකවරුන් විසින් දැනුම් දෙනු ලබන පාසල් භාණ්ඩ ලැයිස්තු සහ පාසල් පිහිටීම් විශ්ලේෂණය කර, ලැබී ඇති තොග බෙදාහැරීම සඳහා මාසික බෙදාහැරීම් සැලසුම් පිළියෙල කරනු ලැබේ.

ඒ අනුව මෙම ඉගෙනුම් උපකාරක ද්‍රව්‍ය ජාතික පාසල් සඳහා හා විශේෂිත විද්‍යා උපකරණ හා රසායන ද්‍රව්‍ය සියලු ම පාසල් සඳහා බෙදාහැරීම් ක්‍රියාවලියේ වාර්ෂික ඉලක්කය ලෙස මාසික ඉලක්කවල සමුච්චිත අගය භාවිතා කරන අතර, ප්‍රගතිය ලෙස එම සමුච්චිත ඉලක්කයට සාපේක්ෂ ව ඉටු කරනු ලැබී ඇති කාර්යභාරය ප්‍රකාශ කෙරේ.

මෙලෙස 2008 වර්ෂයේ දී අධ්‍යාපන සේවා සැපයීම් ශාඛාව විසින් බෙදාහැරීම් සිදු කරන ලද ඉගෙනුම් උපකාරක ද්‍රව්‍ය හා එම ප්‍රදානයන් ලද පාසල් ප්‍රමාණ සහ එම වර්ෂයට අදාළ ව ඉලක්ක සපුරා ගැනීම් ප්‍රගතිය මේ සමඟ අමුණා ඇත.

## 2008 වර්ෂය සඳහා වූ ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ සැපයීමේ සාරාංශ වාර්තාව

| අනු අංකය | වර්ෂයට අදාළ ප්‍රධානතම කාර්යයන් | වාර්ෂික ඉලක්ක | වර්ෂ අවසාන ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | සෞන්දර්ය පෙරදිග සංගීත උපකරණ සැපයීම | සංගීත උපකරණ වර්ග 3 ක් පාසල් 30 ක් අතර | 100% |
| | | සංගීත උපකරණ වර්ග 3 ක් පාසල් 100 ක් අතර | 100% |
| | සෞන්දර්ය චිත්‍ර උපකරණ (චිත්‍ර පුවරු, ඊසල්, පැනල් පුවරු) සැපයීම | උපකරණ වර්ග 3 ක් පාසල් 100 ක් අතර | 100% |
| | සෞන්දර්ය උපකරණ යටතේ මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් සැපයීම | ප්‍රොජෙක්ටර් 30 ක් පාසල් 30 ක් අතර | 100% |
| | සෞන්දර්ය උපකරණ බටහිර තූර්ය වාදක කට්ටල සැපයීම | කට්ටල 25 ක් පාසල් 25 ක් අතර | 100% |
| | | පියානෝ 16 ක් පාසල් 16 ක් අතර | 100% |
| 2 | කෘෂි උපකරණ සැපයීම | ග්ලෝබ් පරිසර අධ්‍යයන උපකරණ වර්ග 31 පාසල් 50 ක් අතර | 100% |
| | | කෘෂි උපකරණ වර්ග 17 ක් පාසල් 50 ක් අතර | 100% |
| | | කෘෂි උපකරණ වර්ග 11 ක් පාසල් 74 ක් අතර | පාසල් 34 |
| | | ග්ලෝබ් පරිසර අධ්‍යයන උපකරණ වර්ග 30 පාසල් 35 ක් අතර | පාසල් 15 |
| 3 | නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ආයතන සඳහා භාණ්ඩ | විශේෂ අධ්‍යාපන ක්‍රීඩා කට්ටල 17 ක් පාසල් 17 ක් අතර | පාසල් 14 |
| | | විශේෂ රූපවාහිනී 10 ක් පාසල් 10 ක් අතර | 100% |
| | | බ්‍රේල් යතුරු ලියන 17 ක් පාසල් 17 ක් අතර | විශේෂිත පාසල් 15 |
| | | බ්‍රේල් මැෂිමක් (මහරගම බ්‍රේල් මුද්‍රණාලය වෙත) | 100% |
| 4 | ක්‍රීඩා උපකරණ සැපයීම | වර්ග 20 ක් පාසල් 326 ක් අතර | 100% |
| 5 | නව ආදර්ශ ප්‍රාථමික පාසල් සඳහා භාණ්ඩ සැපයීම | TV, DVD, OHP තිර, ඡායා පිටපත් යන්ත්‍ර කට්ටලය බැගින් (පළාත් පාසල් ද ඇතුළු) පාසල් 428 ක් අතර | 100% |
| | | පරිගණක, UPS, හා මුද්‍රණ යන්ත්‍ර කට්ටලයක් බැගින් පාසල් 49 ක් අතර | 100% |
| | | පරිගණක මේස, පුටු, පාසල් 75 ක් සඳහා බටහිර තූර්ය වාදක උපකරණ 42 ක් පාසල් 42 ක් අතර | 100% |
| 6 | නවෝද්‍යා පාසල් සඳහා භාණ්ඩ සැපයීම | ඡායා පිටපත් යන්ත්‍ර 50, ඩුප්ලෝ යන්ත්‍ර 27, ෆැක්ස් යන්ත්‍ර 53, රෝනියෝ යන්ත්‍ර 50 ක් | 100% |
| 7 | ජාතික පාසල් සඳහා භාණ්ඩ සැපයීම | FAX යන්ත්‍ර 49, ඡායා පිටපත් යන්ත්‍ර 79, රෝනියෝ යන්ත්‍ර 60 කින් 1 බැගින් ජාතික පාසල් අතර | 100% |
| 8 | වතු පාසල් සඳහා භාණ්ඩ සැපයීම | පරිගණක 5 බැගින් පාසල් 26 ක් අතර | 100% |
| | | මුද්‍රණ යන්ත්‍ර 33 ක් පාසල් 33 ක් අතර | 100% |
| 9 | ප්‍රාථමික අංශ සහා උපකරණ සැපයීම | ඡායා පිටපත් යන්ත්‍ර 38 ක් අතර | 100% |
| 10 | විද්‍යා උපකරණ සැපයීම | විද්‍යා උපකරණ වර්ග 99 ක් හා රසායන ද්‍රව්‍ය වර්ග 88 ක් ජාතික පාසල් හා පළාත් පාසල් 105 ක් අතර අවශ්‍යතාවය අනුව බෙදාදීම | 100% |

# පරිච්ඡේද 6ඃ අධ්‍යාපන වියදම්

## 6.1. පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2008 වර්ෂයේ සත්‍ය පුනරාවර්තන වියදම් රුපියල් මිලියන 19,561 වු අතර ප්‍රතිපාදනය වුයේ රුපියල් මිලියන 20,964කි. ප්‍රතිපාදනය හා වියදම අතර රුපියල් මිලියන 1,403ක වෙනසක් දක්නට ලැබේ.

**වගුව 6.1.1: මුළු ප්‍රතිපාදන හා සත්‍ය වියදම් ( පුනරාවර්තන)** - 2008

| ක්ෂේත්‍රය | ව්‍යාපෘතිය | සමස්ත ප්‍රතිපාදනය 2008 | සත්‍ය වියදම 2008 |
|---|---|---|---|
| 1. | ***පරිපාලන වැඩසටහන*** | | |
| | ඇමති කාර්යාලය | 46,450,000 | 43,309,184 |
| | පරිපාලන හා ආයතනික සේවා | 278,137,000 | 273,193,744 |
| | මුළු එකතුව | 324,587,000 | 316,502,933 |
| | | | |
| 2. | ***සංවර්ධන වැඩසටහන*** | | |
| | ප්‍රාථමික අධ්‍යාපන | 1,890,302,067 | 1,882,009,071 |
| | ද්විතීයික අධ්‍යාපන | 8,632,025,046 | 8,409,762,117 |
| | විශේෂ අධ්‍යාපන | 2,286,160,175 | 2,262,887,516 |
| | ප්‍රදානයන් හා ආධාර | 6,871,874,712 | 5,836,365,657 |
| | සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන | 27,390,000 | 19,504,195 |
| | ගුරු පුහුණු හා සංවර්ධන රාමුව | 918,431,000 | 838,786,721 |
| | සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය සඳහා ආයතනික සහය | 338,000,000 | 312,669,326 |
| | **පුනරාවර්තන එකතුව( සංවර්ධන)** | **20,964,183,000** | **19,561,984,604** |

*මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශ*

**වගුව 6.1.2: ප්‍රතිපාදන හා සත්‍ය වියදම්( ප්‍රාග්ධන) - 2008**

| ක්ෂේත්‍රය | ව්‍යාපෘතිය | සමස්ත ප්‍රතිපාදනය 2008 | සත්‍ය වියදම 2008 |
|---|---|---|---|
| 1. | *පරිපාලන වැඩසටහන* | | |
| | ඇමති කාර්යාලය | 13,828,134 | 12,710,988 |
| | පරිපාලන හා ආයතනික සේවා | 112,371,866 | 107,836,240 |
| 2. | *සංවර්ධන වැඩසටහන* | | |
| | ප්‍රාථමික අධ්‍යාපන | 520,500,000 | 334,026,237 |
| | ද්විතීයික අධ්‍යාපන | 1,155,000,000 | 908,617,116 |
| | විශේෂ අධ්‍යාපන | 28,250,000 | 8,039,710 |
| | ගුරු පුහුණු හා සංවර්ධන රාමුව | 136,000,000 | 63,798,000 |
| | සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය සඳහා ආයතනික සහය | 48,000,000 | 29,395,000 |
| | සාමාන්‍ය අධ්‍යාපන *සංවර්ධන ව්‍යාපෘතිය* | 3,171,250,000 | 1,973,848,260 |
| | **ප්‍රාග්ධන එකතුව** | **5,185,200,000** | **3,438,258,551** |
| | **පුනරාවර්තන හා ප්‍රාග්ධන එකතුව** | **26,149,383,000** | **23,000,243,155** |

*මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය*

මීට අමතර ව පහත දැක්වෙන වගු මගින් ද විස්තර දැක්වේ.

**වගුව 6.1.3 : රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමෙහි සාරාංශය 2008**

| විස්තරය | ආරම්භක ශේෂය | වසරේ ලැබීම් | වසරේ ණය | 2007.12.31 ට ශේෂය |
|---|---|---|---|---|
| සත්‍ය | 2,021,774,732.72 | 612,679,983.22 | 620,447,042.65 | 2,014,007,673.29 |
| නිර්දේශිත සීමා | | 780,000,000.00 | 470,000,000.00 | 2,800,000,000.00 |

*මූලාශ්‍රය - අධ්‍යාපන අමාත්‍යාංශය*

## 6.2. අධ්‍යාපනය සඳහා විදේශ ආධාර ආයෝජන

2008 වර්ෂයේ දී සෘජු ව අධ්‍යාපන අමාත්‍යාංශය හරහා සිදු කළ විදේශාධාර ආයෝජනය රු.මි.2872.82 ක් පමණ විය.මේ සඳහා දායක වූ ලෝක බැංකුව,ආසියානු සංවර්ධන බැංකුව,ආසියානු සංවර්ධන බැංකුව, යුනිසෙෆ් ආයතනය, ජීටීඉසෙඩ් ආයතනය, සේව් ද චිල්රන් ආයතනය හා ස්පේස් (SPACE) ආයතනය වෙන් වෙන් ව කරන ලද ආයෝජනයන් පහත 6.2.1. වගුවෙන් දැක්වේ.

වගුව 6.2.1. අධ්‍යාපනය සඳහා වූ විදේශාධාර ආයෝජන

| මූලාශ්‍රය | වැඩසටහන | වාර්ෂික ආයෝජන රු.මිලියන |
|---|---|---|
| ලෝක බැංකුව | අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන | 635 |
| ආසියානු සංවර්ධන බැංකුව | ද්විතියික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සහ දැනුමැති සමාජයක් සඳහා වූ ව්‍යාපෘතිය | 1499.82 |
| යුනිසෙෆ් | වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම | 398 |
| ජීටීඉසෙඩ් | වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම | 38 |
| සේව් ද චිල්ඩ්‍රන් | වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම | 189 |
| ස්පේස් | වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන | 113 |
| | **එකතුව** | 2872.82 |

මෙම ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩ සටහන් හා ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

## 6.2.1. ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වූ වැඩසටහන්

- පෝෂණ හා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් යටතේ ගුරුවරුන් පුහුණු කිරීම හා ශිෂ්‍ය කඳවුරු පැවැත්වීම
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් පුහුණු කිරීම
- ඉංග්‍රීසි අධ්‍යාපන සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන්
- ප්‍රාදේශීය ඉංග්‍රීසි සම්පත් මධ්‍යස්ථාන සඳහා උපකරණ සැපයීම
- තොරතුරු සන්නිවේදන තාක්ෂණ විෂයට අදාළ පුහුණුව හා ධාරිතා වර්ධනය
- නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කර වෘත්තිකයන්ගේ ධාරිතා වර්ධනය
- ද්විභාෂා නොවන ගුරුවරු ද්වීභාෂා ගුරුවරුන් ලෙස පුහුණු කිරීම
- නුපුහුණු උපාධිධාරීන් පුහුණු කිරිම
- අධ්‍යාපන ප්‍රමිතීන් හා ගුණාත්මක සංවර්ධනය පිළිබඳ විදුහල්පත්වරුන් දැනුවත් කිරිම
- පාසල් බාහිර ඇගයීම් පිළිබඳ නිලධාරීන් පුහුණු කිරීම
- පාසල් පුස්තකාල භාවිතය පිළිබඳ විදුහල්පතිවරුන් ගුරු පුස්තකාලයාධිපතිවරුන් හා ගුරුවරුන් පුහුණු කිරීම
- පාසල්වල භෞතික පහසුකම් පිළිබඳ සමීක්ෂණය
- ගණිත ගුරුවරුන්ගේ ජ්‍යාමිතක දැනුම වර්ධනය සඳහා වැඩසටහන්
- ගණිත ගුරුවරුන්ගේ ඉගෙනුම් ක්‍රම වර්ධනය සඳහා වැඩසටහන්
- අ.පො.ස.(උසස් පෙළ) විෂය නිර්දේශයේ ගැටළු හඳුනාගැනීම සඳහා වැඩසටහන
- පාසල්වලට විද්‍යා උපකරණ සහ රසායන ද්‍රව්‍ය ලබාදීම
- ජාතික විද්‍යා අධ්‍යාපන පස් අවුරුදු සැලැස්ම පිළියෙල කිරීම
- ප්‍රාථමික පාසල්වලට බහුතල ඉගැන්වීම් ක්‍රමවේදය හඳුන්වාදීම
- වතු පාසල් දියුණු කිරීම

### 6.2.2 ආසියානු සංවර්ධන බැංකු ආධාර ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන් සහ කාර්යයන්

- පාසල් 814ක් වෙනුවෙන් රුපියල් මිලියන 60.4ක පාසල් සංවර්ධන මූල්‍ය ප්‍රදාන ලබාදීම
- පරිගණක ඉගෙනුම් මධ්‍යස්ථාන 372ක් සඳහා පරිගණක හා උපාංග ලබාදීම
- පාසල් 99ක් සඳහා උසස් පෙළ හා සාමාන්‍ය පෙළ විද්‍යාගාර ස්ථාපිත කිරීම හා විද්‍යාගාර උපකරණ බෙදාදීම
- පාසල් 107ක් සඳහා බහුමාධ්‍ය ඒකක ස්ථාපිත කිරීම
- පාසල් 690ක වැඩිදියුණු කටයුතු සිදු කිරීම
- පාසල් 81ක ක්‍රියාකාරකම් කාමර, පුස්තකාල හා කෘෂිකාර්මික මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම
- පාසල් 943ක් සඳහා පරිගණක හා උපාංග ලබාදීම
- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ව ගුරුභවතුන් 9,000ක් සඳහා ICDL / CAL ගුරු පුහුණු ශිෂ්‍යත්ව පිරිනැමීම
- e-Citizen පුහුණු පාඨමාලාව නිලධාරීන් හා විදුහල්පතිවරුන් 490ක් සඳහා ලබාදීම
- අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන් සඳහා සිසුදිරිය ශිෂ්‍යත්ව 15,000ක් ලබාදීම
- කෙටිකාලීන ගුරු පුහුණු ශිෂ්‍යත්ව - Short ICT Course (දින 05) 710ක් ලබාදීම
- ඊ ගම්මාන ව්‍යාපෘතිය යටතේ පාසල් 30ක ඊ ගම්මාන ස්ථාපිත කිරීම
- පළාත් අධ්‍යාපන මෘදුකාංග නිර්මාණ තරගාවලිය සඳහා ගුරුභවතුන් හා සිසුන් අධ්‍යාපන නිර්මාණ හා මෘදුකාංග 36,314ක් ඉදිරිපත් කිරීම